ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2017

විෂය අංකය / பாட இலக்கம் : **21**

විෂයය / பாடம் : **ආර්ථික විද්‍යාව**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

### I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 5 | 21. | 4 | 31. | 3 | 41. | 3 |
| 02. | 5 | 12. | 1 | 22. | 1 | 32. | 1 | 42. | 5 |
| 03. | 4 | 13. | 4 | 23. | 5 | 33. | 4 | 43. | 4 |
| 04. | 1 | 14. | 4 | 24. | 3 | 34. | 1 | 44. | 2 |
| 05. | 1 | 15. | 1 | 25. | 2 | 35. | 2 | 45. | 2 |
| 06. | 5 | 16. | 3 | 26. | 5 | 36. | 3 | 46. | 4 |
| 07. | 2 | 17. | 1 | 27. | 1 | 37. | 4 | 47. | 5 |
| 08. | 2 | 18. | 2 | 28. | 1 | 38. | 3 | 48. | 1 |
| 09. | 5 | 19. | 5 | 29. | 3 | 39. | 2 | 49. | 4 |
| 10. | 5 | 20. | 4 | 30. | 1 | 40. | 2 | 50. | 5 |

◎ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 01 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 1 × 50 = 50

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2017 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2017 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2017

| | | |
|---|---|---|
| ආර්ථික විද්‍යාව II<br>பொருளியல் II<br>Economics II | 21 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>*Three hours* |


**උපදෙස් :**

* 'අ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, 'ආ' උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන, ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
* ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

## 'අ' උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

1. (i) සිවිල් භාණ්ඩ සහ මිලිටරි භාණ්ඩ පමණක් නිෂ්පාදනය කරනු ලබන උපකල්පිත ආර්ථිකයකට අදාළ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පහත රූපසටහනෙහි දැක්වේ. එම ආර්ථිකය දැනට K ලක්ෂ්‍යයෙහි නිෂ්පාදනය කරමින් සිටී යයි සලකන්න.




(අ) මෙම ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය, වැඩෙන ආවස්ථික පිරිවැය පිළිබිඹු කරන්නේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකය යුද්ධයකට එළැඹෙන්නේ නම්, නිෂ්පාදන ලක්ෂ්‍යය වෙනස් වීමට වඩාත් ඉඩක් ඇත්තේ K ලක්ෂ්‍යයේ සිට කවර ලක්ෂ්‍යයක් කරා ද? පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ඇ) ආර්ථිකය ප්‍රතිගමනයකට හෙවත් පසුබෑමකට මුහුණ දෙනු ලැබුවහොත්, නිෂ්පාදන ලක්ෂ්‍යය වෙනස් වනුයේ K ලක්ෂ්‍යයේ සිට කවර ලක්ෂ්‍යයක් කරා ද? පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රමික විශේෂණය, ආර්ථිකයක නිෂ්පාදන මට්ටම ඉහළ නැංවීමට හේතු වන්නේ ඇයි දැයි පැහැදිලි කෙරෙන හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) හිඟකම පිළිබඳ සංකල්පය, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් ආධාර කර ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) වෙළෙඳපොළ ආර්ථිකයක මිල යාන්ත්‍රණයේ කවර කාර්යයන් ඉටු කරනු ලැබේ ද? (ලකුණු 03 යි)

(v) විධාන ආර්ථිකයක අවාසි කවරේ දැයි සඳහන් කරන්න. (ලකුණු 04 යි)

1. (i) (අ) - ඔව් (ලකුණු 01 යි)

- මෙම ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මූලයට අවතලව පිහිටා ඇත. ඉන් අදහස් වන්නේ, සිවිල් භාණ්ඩ නිෂ්පාදනය වැඩි කරනු ලබන සෑම අතිරේක ඒකකයක් සඳහාම, මිලිටරි භාණ්ඩවලින් මනිනු ලබන ආවස්ථික පිරිවැය (රේඛාවේ බෑවුමෙන් දැක්වෙන ආකාරයට) ඉහළ නගින බවය. ඒ අන්දමටම, මිලිටරි භාණ්ඩ නිෂ්පාදනය වැඩි කරන විට ද, සිවිල් භාණ්ඩවලින් දැක්වෙන ආවස්ථික පිරිවැය ඉහළ නගී. (ලකුණු 01 යි)

(ලකුණු 01 යි)

(ආ) - T ලක්ෂ්‍යය වේ.

- යුද්ධය කිරීම සඳහා මිලිටරි භාණ්ඩ යොදාගත යුතු වන බැවින් විශාල වශයෙන් (මුළුමනින්ම නොව) මිලිටරි භාණ්ඩ ඇතුළත් කාර්යක්ෂම නිෂ්පාදන ලක්ෂ්‍යක් තෝරා ගනු ලැබේ. M ලක්ෂ්‍යය තෝරා නොගනුයේ එහි දී කිසිදු සිවිල් භාණ්ඩයක් නිෂ්පාදනය නොවන බැවිනි. අවම ජීවන මට්ටමක් පවත්වාගෙන යාම සඳහා සිවිල් භාණ්ඩ ද කිසියම් ප්‍රමාණයක් අවශ්‍ය කෙරේ. (ලකුණු 01 යි)

(ඉ) - U ලක්ෂ්‍යය වේ. (ලකුණු 01 යි)

- ආර්ථික ප්‍රතිගමනයක් හෙවත් පසුබැසීමක් ලෙස සැලකෙනුයේ සමාහාර ඉල්ලුමෙහි ඌනතාවක් නිසා අවම වශයෙන් මාස 6 ක පමණ කාලයක් මුළුල්ලේ ආර්ථිකය විශාල පසුබෑමකට මුහුණ දීමය. එය කෙටි කාලීන ප්‍රපංචයක් වන බැවින් ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාවට (විභව නිමැවුම) බලපෑමක් නොකරයි. එහෙත් ප්‍රතිගමනයක දී ආර්ථිකයේ පවත්නා නිෂ්පාදන ධාරිතාව ඌන උපයෝජනයකට ලක්වන බැවින්, එම තත්වය නිරූපණය කරනුයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ ඇතුළත ලක්ෂ්‍යයක් මගිනි. (ලකුණු 01 යි)

(ii) - ශ්‍රමික විභාජනය නිසා නිෂ්පාදන ක්‍රියාවලියේ කුඩා කුඩා අංශ කෙරෙහි සේවකයන් අනුයුක්ත කළ හැකි වන බැවින් විශේෂ ප්‍රාගුණ්‍යනයකට අවස්ථාව සැලසේ. විවිධ පුද්ගලයන්ගේ නිපුණතා, හැකියා හා බැඳියාවන් වෙනස් බැවින් තමන්ට වඩාත් ගැළපෙන ක්‍රියාකාරකම් තෝරාගෙන ඒවායේ නිරතවීමෙන් ශ්‍රම ඵලදායිතා ඉහළ නගී. කිසියම් සේවකයෙකුට ක්‍රියාකාරකම් සමූහයක් කිරීමට සිදු වුවහොත් ඒ සියලු ක්‍රියාකාරකම් පිළිබඳ එක හා සමාන දක්ෂතාවක් ඔහුට නොතිබෙන බැවින් ඔහුගේ ඵලදායිතාව අඩු ය.

- කිසියම් ක්‍රියාකාරකමක විශේෂ ප්‍රාගුණ්‍යනය කරනු ලබන සේවකයෝ එම කටයුත්ත වඩාත් ඉක්මනින් සහ වඩාත් ගුණාත්මකව කිරීමට ඔහු ඉගෙන ගනිති. සැබැවින්ම විශේෂ ප්‍රාගුණ්‍යය කළ සේවකයන්ට තමන්ගේ ක්‍රියාකාරකම වඩාත් ඉක්මනින් සහ හොඳින් ඉටුකිරීමට හැකි අන්දමේ නව්‍යතාවන් යෝජනා කිරීමට ද පිළිවන.

- ශ්‍රමික විභාජනය හා ඒ ආශ්‍රිත විශේෂ ප්‍රාගුණ්‍යනය ඔස්සේ පරිමාණානුකූල පිරිමැසුම් වාසි අත්කර ගැනීමට ද ව්‍යාපාරිකයන්ට හැකියාව ලැබේ. විශාල නිමැවුම් ප්‍රමාණයක් එක් එක් නිෂ්පාදන ක්‍රියාවලිය තුළ නිපදවන බැවින් ඒවායේ ඒකක පිරිවැය පහළ බසී.


- නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යන්ත්‍ර භාවිතා කිරීමට ඇති ඉඩ කඩ විශාල වේ. නිෂ්පාදන ක්‍රියාවලිය කුඩා ක්‍රියාකාරකම්වලට වෙන් කොට ඇති බැවින් එක් එක් ක්‍රියාකාරකමට යෝග්‍ය යන්ත්‍ර සූත්‍ර උපකරණ හඳුන්වා දෙමින් ඵලදායිතාව ඉහළ නංවා ගත හැකි වේ.

- සේවකයන්ට එක් ක්‍රියාවලියක සිට තවත් ක්‍රියාවලියක් කරා නිතර නිතර මාරු වීමේ

අවශ්‍යතාවක් පැන නොනගින බැවින් ශ්‍රමික විභාජනය නිසා ශ්‍රමික කාලය අපතේ යාමක් ද සිදු නොවේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03 යි)

(iii) - මිනිස් වුවමනා සපුරා ගැනීම සඳහා පවත්නා සම්පත් ප්‍රමාණය සීමිත වීම හිඟකම වශයෙන් අදහස් කෙරේ. මිනිස් වුවමනා අසීමිත වන අතර ඒවා තෘප්තිමත් කර ගැනීමට තිබෙන සම්පත් ප්‍රමාණය ඉතා සීමිත වේ. (ලකුණු 02 යි)




නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් පෙන්නුම් කරනුයේ යම් දෙන ලද අවස්ථාවක ආර්ථිකයේ පවත්නා සම්පත් සම්භාරය පවත්නා තාක්ෂණය යටතේ කාර්යක්ෂම ලෙස උපයෝජනය කරනු ලැබුව හොත්, අත්කර ගත හැකි උපරිම භාණ්ඩ ප්‍රමාණයන් ය. මෙම රූප සටහනෙහි b, c සහ d වැනි ලක්ෂ්‍යයන් අත්කර ගත හැකි ලක්ෂ්‍යයන් වේ. නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයෙන් දකුණු පසට ඇති a ලක්ෂ්‍යය වැනි නිෂ්පාදන සංයෝගයක් මෙම අවස්ථාවේ දී අත්කර ගත හැකි නොවේ. a ලක්ෂ්‍යය මිනිස් වුවමනා පෙන්නුම් කරනු ලබන භාණ්ඩ සංයෝගයක් වශයෙන් සලකනු ලැබුවහොත්, පවත්නා සම්පත් සම්භාරය හා තාක්ෂණය යටතේ එම ලක්ෂ්‍යයෙහි නිෂ්පාදනයක් කිරීමට ආර්ථිකයට හැකියාවක් නැත. මේ අන්දමින් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයට පිටතින් පිහිටි අත්කර ගත නොහැකි භාණ්ඩ සංයෝගය දැක්වෙන ලක්ෂ්‍යයන් හිඟකම නිරූපණය කරයි.

(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 01 යි, පැහැදිලි කිරීමට ලකුණු 01 යි)

(iv) - සංඥා සැපයීමේ කාර්යය : වෙළෙඳපොළ තුළ කටයුතු කරන ආර්ථික ඒකකයන්ට (පාරිභෝගිකයන් සහ නිෂ්පාදකයන්ට) තීරණ ගැනීම සඳහා අදාළ තොරතුරු මිල සංඥා මගින් ලබා දීම. (ලකුණු 01 යි)

- සානුබල සැපයීමේ කාර්යය : සැපයුම්කරුවන් සහ විකුණුම්කරුවන් විසින් මිල සංඥා කෙරෙහි කාර්යක්ෂම ලෙස ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය කෙරෙන සානුබල ලබාදීම. (ලකුණු 01 යි)

- සළාකන කාර්යය : හිඟ සම්පත් විකල්ප භාවිත අතර බෙදා වෙන්කොට දීම හෙවත් සළාක කොටදීම. (ලකුණු 01 යි)

(v) - සමාජයීය අවශ්‍යතා නොසළකා හැරේ.

- පාරිභෝගික ස්වාධීපත්‍යය සහ තෝරීමේ නිදහස අහිමි වේ.
- සම්පත් හා දේපොළ පිළිබඳ පෞද්ගලික හිමිකමට ඉඩක් නොමැති බැවින් වෙහෙසී වැඩකිරීමට සානුබල නොපවතී.
- සානුබල නොපවතින බැවින් නව්‍යතාවන් සංවර්ධනය සඳහා යොමුවීම වැළැකේ.
- තරගය නොමැති බැවින් අකාර්යක්ෂමතා ඇත.
- මිල පාලනයන් නිසා කළුකඩ පැන නැගීමේ ප්‍රවණතාවක් ඇත.
- ආර්ථිකයේ සම්බන්ධීකරණය සහ කළමනාකරණය ගැටලුකාරී වේ.
- නිලධාරීවාදය
- රාජ්‍ය ඒකාධිකාරය
- ආර්ථික වෘද්ධිය මන්දගාමී වීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

2. (i) කිසියම් භාණ්ඩයක ඉල්ලුම කෙරෙහි බලපෑ හැකි එම භාණ්ඩයේ මිල හැර අන් සාධක සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(ii) ඉල්ලුම වෙනස්වීම සහ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස්වීම අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)
(iii) 'සැපයුම් නීතිය' නිර්වචනය කොට ඒ කෙරෙහි බලපාන හේතු පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(iv) කිසියම් භාණ්ඩයක් සඳහා නිෂ්පාදන සහනාධාරයක් ලබා දුන් විට, නිෂ්පාදකයන් භුක්ති විඳින අතිරික්තය කෙරෙහි එය බලපාන ආකාරය, ඉල්ලුම් සැපයුම් රූපසටහනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(v) අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩයක් සඳහා රජය විසින් උපරිම මිලක් පැනවීමේ ආර්ථික ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 05 යි)

2. (i)
- සම්බන්ධිත භාණ්ඩවල මිල
- පාරිභෝගිකයන්ගේ ආදායම සහ ධනය
- පාරිභෝගිකයන්ගේ අභිරුචිය සහ වරණය
- අනාගත මිල පිළිබඳ අපේක්ෂාවන්
- ප්‍රචාරණය
- බදු අයකිරීමේ මට්ටම
- ජනගහනය/ ගැනුම්කරුවන් සංඛ්‍යාව
- මිනිසාගේ පාලනයෙන් පරිබාහිර කාලගුණය වැනි සාධක

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03 යි)

(ii)
- ඉල්ලුම වෙනස්වීම යන්නෙන් අදහස් කරන්නේ ඉල්ලුම් වක්‍රය මුළුමනින්ම විතැන් වීමකි. එනම් සෑම මිලක්දීම මිල දී ගනු ලබන ප්‍රමාණය වෙනස් වීමකි.

(ලකුණු 02 යි)

- ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණය වෙනස්වීම යන්නෙන් අදහස් කරනුයේ ඉල්ලුම් වක්‍රය මත එක් ලක්ෂ්‍යයක සිට තවත් ලක්ෂ්‍යයක් කරා ගමන් කරන විට ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ සිදුවන වෙනස්වීම ය. ඉල්ලුම් වක්‍රයේ එක් එක් ලක්ෂ්‍යයක් පෙන්නුම් කරනුයේ, කිසියම් නිශ්චිත මිලක දී ඉල්ලුම් කරනු ලබන නිශ්චිත ප්‍රමාණයකි. මේ අනුව විවිධ ලක්ෂ්‍යයන් පෙන්නුම් කරනුයේ ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයේ වෙනස් වීම ය. (ලකුණු 02 යි)

(iii)
- අනෙකුත් කරුණු නොවෙනස් ව තිබිය දී, මිල ඉහළ යන විට වැඩි ප්‍රමාණයක්


සපයනු ලබන අතර, මිල පහළ බසින විට අඩු ප්‍රමාණයක් සපයෙනු ලැබේ.
(ලකුණු 02 යි)

විකල්ප පිළිතුර :

- අනෙකුත් කරුණු නොවෙනස්ව තිබිය දී වෙළෙඳපොළ මිල සහ සපයනු ලබන ප්‍රමාණය අතර අනුලෝම සම්බන්ධයක් පවතී. (ලකුණු 02 යි)

- නිෂ්පාදන ධාරිතාව සහ යෙදවුම් මිල නොවෙනස් ව තිබිය දී (එනම් කෙටි කාලයේ දී), නිෂ්පාදනය කරනු ලබන ඒකක ප්‍රමාණය වැඩි කරන විට, ආන්තික පිරිවැය ඉහළ නගී. "වැඩිවන ආවස්ථික පිරිවැය නීතිය" නමින් හඳුන්වනුයේ ද මේ අදහස ය. එබැවින් ආන්තික පිරිවැයවත් අඩු තරමින් ආවරණය නොවන මිලක් යටතේ නිෂ්පාදනයෙහි යෙදීම අර්ථවත් නොවන අතර, වැඩිපුර ඒකකයක් සැපයීම සඳහා නිෂ්පාදකයා පෙරට වඩා වැඩි මිලක් අපේක්ෂා කරයි. (ලකුණු 02 යි)

(iv)




(නිවැරදි රූප සටහනට ලකුණු 02 යි)

- නිෂ්පාදක අතිරික්තය කෙරෙහි සහනාධාරයේ බලපෑම :

| සහනාධාරයට පෙර නිෂ්පාදක අතිරික්තය | සහනාධාරයට පසු නිෂ්පාදක අතිරික්තය | නිෂ්පාදක අතිරික්තයේ වෙනස්වීම |
|---|---|---|
| C + D | B + C + D + E | B + E ප්‍රමාණයෙන් වැඩි වේ. |

(ලකුණු 02 යි)

(v)

- අධි ඉල්ලුමක් හෙවත් භාණ්ඩ හිඟයක් පැනනගී. එබැවින් පාලන මිලට වඩා වැඩි මිලට භාණ්ඩ අලෙවි කෙරෙන කළු කඩ පැන නැගීමේ ප්‍රවණතාවක් හට ගනී.

- මිල නොවන මාධ්‍ය ඔස්සේ සළාකන යාන්ත්‍රණයන් බිහිවේ. සීමිත භාණ්ඩ ප්‍රමාණය කවර පාරිභෝගිකයන්ට ලබා දෙනවා ද යන්න දිගු පෝලිම් ඔස්සේ හෝ කල්තබා වෙන්කර තබා ගැනීම ඔස්සේ හෝ තීරණය විය හැකිය.

- හිඟ භාණ්ඩ සොයා යාමේ පිරිවැය : කාලය සහ මුදල් වැය වේ.

- ශුභ සාධන ප්‍රතිවිපාක : නිෂ්පාදක අතිරික්තය පහළ වැටේ. පාරිභෝගික අතිරික්තය ඉහළ නගී.

- සම්පත් බෙදා වෙන් කිරීම අකාර්යක්ෂම වේ.

- එදිනෙදා ජීවිතයට අත්‍යවශ්‍ය භාණ්ඩයක් වේ නම් උපරිම මිල නියම කිරීම නිසා කලින් එම භාණ්ඩය මිල දී ගැනීමට හැකියාවක් නොතිබුණු පුද්ගලයන්ට එය ලබා ගැනීමට හැකියාව ලැබේ. දුප්පත් සහ ආර්ථික වශයෙන් සවිබල නැති පුද්ගලයන්ගේ ශුභ සාධනය වෙනුවෙන් ලැබෙන විශාල සහනයකි.

- නිෂ්පාදකයන්ට අඩු මිලකට භාණ්ඩ විකිණීමට සිදුවන අතර ඔවුන්ගේ ආදායම පහළ වැටේ.

- උපරිම මිල ප්‍රතිපත්තියේ අහිතකර ප්‍රතිවිපාක සමනය කිරීම සඳහා රජයට වියදම් වැඩි කර ගැනීමට සිදුවේ. නිෂ්පාදකයන්ට සහනාධාරයක් ලබාදීමට හෝ සැපයුම් වක්‍රය දකුණට විතැන් කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට හෝ සිදුවනු ඇත. එම ක්‍රියාමාර්ග වල ආවස්ථික පිරිවැයක් පවතී. වෙනත් අත්‍යවශ්‍ය ක්ෂේත්‍රවල රජයට වැය කිරීමට ඇති මුදල් කිසියම් ප්‍රමාණයකට කපා හැරීමට සිදුවනු ඇත.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05 යි)

3. (i) නිෂ්පාදන ආයතනයක කෙටි කාලීන පිරිවැය වක්‍රවල හැඩය හීනවන ඵල නීතිය සම්බන්ධ වන්නේ කෙසේ ද? (ලකුණු 04 යි)

(ii) ආයතනයක් කෙටි කාලයේ දී නිෂ්පාදනය ප්‍රසාරණය කරනු ලබන විට, සාමාන්‍ය මුළු පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර වෙනසට කුමක් සිදුවේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය කෙරෙහි පහත සඳහන් දෑ බලපානුයේ කවර ආකාරයෙන් ද?

(අ) විදුලිබල ගාස්තු පහළ වැටීමක්

(ආ) වැටුප් අනුපාතිකයේ පහළ වැටීමක්

(ඇ) ප්‍රධාන විධායක නිලධාරියාගේ වේතනයේ ඉහළ යාමක්

(ඈ) ආයතනයේ ගොඩනැගිලිවල බදු කුලී ඉහළ යාමක් (ලකුණු 04 යි)

(iv) පූර්ණ තරඟකාරී වෙළෙඳපොළ ව්‍යුහයක් සහ කතිපයාධිකාරී වෙළෙඳපොළ ව්‍යුහයක් අතර දක්නට ලැබෙන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(v) ප්‍රාමාණික ලාභය සහ අධිප්‍රාමාණික ලාභය අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)

(i) - නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී, ස්ථාවර යෙදවුම් සමග මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම ප්‍රමාණයෙන් වැඩි කරන විට, විචල්‍ය යෙදවුමේ ආන්තික සහ සාමාන්‍ය ඵලදාව එක්තරා අවස්ථාවකට පසුව පහළ බැසීම "හීනවන ඵලනීතිය" නම් වේ.

(ලකුණු 02 යි)

- පිරිවැය ශ්‍රිතය සහ නිෂ්පාදන ශ්‍රිතය එකිනෙකට සමාන්තුපාතික වේ. නිෂ්පාදනය සහ පිරිවැය යනු එකම ක්‍රියාකාරකමක පැතිකඩ දෙකක් පමණි. පිරිවැය ශ්‍රිතය ව්‍යුත්පන්න කරගනුයේ නිෂ්පාදන ශ්‍රිතයෙනි.

- ආන්තික පිරිවැය (MC) වක්‍රය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) වක්‍රය ඉංග්‍රිසි

U - අකුරේ හැඩය ගනු ලබන අතර, ආන්තික ඵලදා (MP) වක්‍රය සහ සාමාන්‍ය ඵලදා (AP) වක්‍රය ප්‍රතිවිරුද්ධ U - අකුරේ හැඩය ගනී. සාමාන්‍ය ඵලදාව (AP), ආන්තික ඵලදාවට (MP) සමාන වනුයේ, සාමාන්‍ය ඵලදාව එහි උපරිම අගය හිමිකර ගන්නා විට දී ය. එහෙත් සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) ආන්තික පිරිවැය (MC) ට සමාන වනුයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැයෙහි අවම අගයේ දී ය.

- ආන්තික ඵලදාව (MP) එහි උපරිම අගය ගන්නා විට ආන්තික පිරිවැය (MC) අවම අගය පෙන්නුම් කරයි.

- විචල්‍ය යෙදවුම වැඩි කරන්ම ආන්තික ඵලදාව (MP) පහළ වැටෙන අතර, ආන්තික පිරිවැය ඉහළ නගී. නමුත් එහි දී සාමාන්‍ය ඵලදාව තවදුරටත් ඉහළ නගිමින් පවතින අතර, සාමාන්‍ය විචල්‍ය පිරිවැය පහළ බසිමින් පවතී. සාමාන්‍ය විචල්‍ය පිරිවැය එහි අවම අගය දක්වා අඩු වී නැවතත් ඉහළ නැගීමට පටන් ගනී.

- ආන්තික ඵලදාව (MP) ඉහළ නැග පහළ බසී. ආන්තික ඵලදා වක්‍රය හා සාමාන්‍ය ඵලදා වක්‍රය එකිනෙක ඡේදනය වනුයේ සාමාන්‍ය ඵලදාව උපරිම අගය ගන්නා අවස්ථාවේ දී ය. ඉන්පසු ආන්තික ඵලදාව සාමාන්‍ය ඵලදාවට වඩා වේගයෙන් පහළ බසී. එයට අනුරූපීව, ආන්තික පිරිවැය ද පහළ වැටී ඉහළ නැගීමට පටන් ගනී. ආන්තික පිරිවැය වක්‍රය සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය සමග ඡේදනය වනුයේ සාමාන්‍ය විචල්‍ය පිරිවැයෙහි අවම අගයේ දී ය. ඉන්පසු ආන්තික පිරිවැය සාමාන්‍ය විචල්‍ය පිරිවැයට වඩා වේගයෙන් ඉහළ නගී.

(සම්බන්ධය පැහැදිලි කෙරෙන ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)

(ii) - කෙටි කාලයේ දී ආයතනයක් නිෂ්පාදනය ප්‍රසාරණය කරන විට සාමාන්‍ය මුළු පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර වෙනස කුඩා වේ.

(ලකුණු 01 යි)

- සාමාන්‍ය මුළු පිරිවැය සහ සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර වෙනසට හේතුව සාමාන්‍ය ස්ථාවර පිරිවැයයි.

- නිෂ්පාදනය, ක්‍රම ක්‍රමයෙන් වැඩි කරන්ම සාමාන්‍ය ස්ථාවර පිරිවැයෙහි වැදගත්කම ක්‍රමයෙන් අඩුවන බැවින්, සාමාන්‍ය මුළු පිරිවැය වක්‍රය සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රයට ක්‍රමයෙන් ළං වේ.

- ඉහළ නිමැවුම් පරාසයක දී සාමාන්‍ය ස්ථාවර පිරිවැය අතිශයින් නොවැදගත් අගයක් පෙන්නුම් කරන අතර, සමස්ත පිරිවැය තුළ විචල්‍ය පිරිවැය ආධිපත්‍යය හිමිකර ගනී.

- කෙසේ වෙතත් සෑම නිමැවුම් මට්ටමක දී ම සාමාන්‍ය මුළු පිරිවැය හා සාමාන්‍ය විචල්‍ය පිරිවැය අතර පරතරයක් පවතින නමුදු, නිෂ්පාදනය වැඩි කරන්ම මේ පරතරය ක්‍රම ක්‍රමයෙන් අඩුවීමට නැඹුරු වේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු තුනකට ලකුණු 03 යි)

(iii) - (අ) සාමාන්‍ය මුළු පිරිවැය (ATC) පහළ වැටේ, සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) පහළ වැටේ.

(ආ) සාමාන්‍ය මුළු පිරිවැය (ATC) පහළ වැටේ, සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) පහළ වැටේ.

(ඉ) සාමාන්‍ය මුළු පිරිවැය (ATC) ඉහළ නගී, සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) වෙනස් නොවේ.

(ඊ) සාමාන්‍ය මුළු පිරිවැය (ATC) ඉහළ නගී, සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) වෙනස් නොවේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(iv)

| පූර්ණ තරගකාරී වෙළෙඳපොළ | කතිපයාධිකාරී වෙළෙඳපොළ |
|---|---|
| - විකුණුම්කරුවන් විශාල සංඛ්‍යාවක් සිටීම. | - විකුණුම්කරුවන් අතළොස්සක් පමණක් සිටීම. |
| - සමජාතීය භාණ්ඩයක් අලෙවි කිරීම. | - සමජාතීය වූ හෝ ප්‍රභේදනය වූ හෝ භාණ්ඩයක් වීම. |
| - අබාධ ප්‍රවේශය සහ පිටවීම. | - ප්‍රවේශය බාධාකාරී වීම. |
| - අන්‍යෝන්‍ය රැඳියාවක් දක්නට නොතිබීම. | - දැඩි ලෙස අන්‍යෝන්‍ය රැඳියාව පැවැතීම. |
| - ආයතනය මිල ගනුවෙකි | - ආයතනය මිල සපයන්නෙකි. |
| - වෙළෙඳපොළ පිළිබඳ පූර්ණ දැනුම පැවැතීම. | - වෙළෙඳපොළ තොරතුරු ලබාගැනීම අතිශය දුෂ්කර වීම හා රහසිගත වීම. |
| - ප්‍රචාරණය නොමැත. | - ප්‍රචාරණය පවතී. |

(නිවැරදි සංයෝජනයකට ලකුණු 02 බැගින් ඕනෑම සංයෝජන දෙකකට ලකුණු 04 යි)

(v)

- කිසියම් ව්‍යවසායකයෙකු පවත්නා නිෂ්පාදන ක්‍රියාවලියෙහි රඳවා තබා ගැනීම සඳහා එම ව්‍යවසායකයා අපේක්ෂා කරන අවම ගෙවීම ප්‍රාමාණික ලාභය ලෙස හැඳින්වේ.

- ව්‍යවසායකයෙකු ප්‍රාග්ධනය ඇතුළු විවිධ ව්‍යවසායක සම්පත් සංචල කරමින් සහ අවදානමක් දරමින් නිෂ්පාදන කාර්යයෙහි නියැළීමේ දී, එම ප්‍රයත්නයට සරිලන අවම ගෙවීමක් ඔහු අපේක්ෂා කරයි. ව්‍යවසායක කාර්යභාරය ඉටු කිරීම වෙනුවෙන් ලැබිය යුතු ගෙවීමක් වන නිසා ප්‍රාමාණික ලාභය ආරෝපිත පිරිවැයකි.

- පවත්නා නිෂ්පාදන ක්‍රියාවලිය තුළ එම අවම ගෙවීමවත් ඔහුට උපයාගත නොහැකි වේ නම් ඔහු තම ව්‍යවසායකත්වය එම ව්‍යාපාරයෙන් ඉවත් කර ගනී.

(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)

- නිෂ්ප්‍රාමාණික ලාභය හෝ අති ප්‍රාමාණික ලාභය වශයෙන් හඳුන්වන්නේ ව්‍යවසායකයෙකු තම ප්‍රාමාණික ලාභය ඉක්මවා උපයාගනු ලබන ලාභ ප්‍රමාණයට ය.

- නිෂ්පාදන ආයතනයේ මුළු අයභාරයෙන් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා උපයෝජනය කළ සියලුම ආවස්ථික පිරිවැය (ආර්ථික පිරිවැය) අඩු කළ විට, ශේෂ වන අතිරික්තයයි.

- ප්‍රාමාණික ලාභය නිෂ්පාදන පිරිවැයෙහි කොටසක් වුව ද, නිෂ්ප්‍රාමාණික ලාභය පිරිවැයෙහි කොටසක් නොව, පිරිවැය ඉක්මවා ලැබෙන අතිරික්තයකි.

- ව්‍යාපාරය ගෙනයාමේ දී ව්‍යවසායකයාට දැරීමට සිදුවන අවදානම සහ අවිනිශ්චිතතාව වෙනුවෙන් ලැබෙන ප්‍රතිලාභයක් ලෙස නිෂ්ප්‍රාමාණික ලාභ සැලකිය හැකිය. වෙළෙඳපොළ ඒකාධිකාරී බලය නිසාත් හුදු අහඹු හේතු නිසාත් මෙවැනි අතිරික්තයන් හටගත හැකිය.

(ඕනෑම එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු දෙකකට ලකුණු 02 යි)

විකල්ප පිළිතුරක් :

නිෂ්පාදන ආයතනයකට, තම මුළු අයභාරය (TR) මුළු පිරිවැයට (TC) සමාන වූ විට ප්‍රාමාණික ලාභ උපයා ගත හැකි අතර, නිෂ්ප්‍රාමාණික ලාභ උපයා ගත හැක්කේ මුළු අයභාරය මුළු පිරිවැය ඉක්මවා ගිය විට දී පමණි.

(ලකුණු 02 යි)

4. (i) ආදායම් චක්‍රීය ප්‍රවාහයේ 'විදීම්' සහ 'කාන්දුවීම්' යන්නෙන් කවරක් අදහස් වන්නේ දැයි පැහැදිලි කොට, ආණ්ඩුවේ කටයුතු සහිත විවෘත ආර්ථිකයක සමාහාර වියදමේ දක්නට ලැබෙන කාන්දුවීම් හඳුන්වන්න. (ලකුණු 04 යි)

(ii) දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රධාන සංරචක කවරේ ද? (ලකුණු 04 යි)

(iii) දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබන ආකාරය පැහැදිලි කොට, වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතය ශුද්ධ ජාතික ආදායමෙන් වෙනස් වන්නේ කෙසේ දැයි පෙන්වන්න. (ලකුණු 04 යි)

(iv) ව්‍යාපාර චක්‍රයක ප්‍රසාරණය ආර්ථික වර්ධනයෙන් වෙනස් වූවක් ලෙස අප සලකන්නේ ඇයි? (ලකුණු 04 යි)

(v) 2016 වර්ෂය සඳහා කිසියම් ආර්ථිකයක සාර්ව ආර්ථික දත්ත පහත වගුවේ දැක්වේ.

(සියලු ම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

| අයිතමය | වටිනාකම |
|---|---|
| දළ ආයෝජනය (I) | 200 |
| බදු (T) | 550 |
| අපනයන (X) | 375 |
| පරිභෝජන වියදම (C) | 700 |
| සංක්‍රාම ගෙවීම ($T_R$) | 300 |
| ආනයන (M) | 325 |
| ආණ්ඩුවේ මිල දී ගැනීම (G) | 300 |

(අ) මෙම ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ආර්ථිකයේ පෞද්ගලික වැය කළ හැකි ආදායම කොපමණ ද? (ලකුණු 02 යි)

4. (i)

- ආදායම් චක්‍රීය ප්‍රවාහයේ විදීම යනු ඔවුනොවුන් අතර සිදුවන ලැබීම ප්‍රවාහයන්ගෙන් පරිබාහිරව, ආයතන වලට සහ කුටුම්භ වලට ලැබෙන ලැබීම ය.

(ලකුණු 01 යි)

- විදීම හේතුකොට ස්වයංජාත සමාහාර වියදම් ඉහළ යන අතර, ඒවා ආදායමේ

බහුවිධ ප්‍රසාරණයන් ජනනය කිරීමට සමත් වේ.

- ආයෝජන වියදම් (I) , ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) සහ අපනයන (X) යන ස්වායත්ත වියදම් වලින් විදීම් සමන්විත වේ.
  (එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම එක් කරුණකට ලකුණු 01 යි)

- ආයතන වලට හෝ කුටුම්බ වලට හෝ ලැබෙන ලැබීම් (ඉපැයීම්) වලින් වියදමක් ලෙස දේශීය නිෂ්පාදිතය මත වැය නොකෙරෙන ප්‍රමාණය චක්‍රීය ආදායම් ප්‍රවාහයේ කාන්දුවීමක් හෝ ගිලිහීයාමක් හෝ ලෙස දැක්විය හැකිය. කාන්දුවීම් නිසා ආදායම් - වියදම් ප්‍රවාහය දුබල වේ. (ලකුණු 01 යි)

- ආණ්ඩුවේ කටයුතු සහිත විවෘත ආර්ථිකයක සමාහාර වියදමේ කාන්දුවීම් සමන්විත වනුයේ ඉතුරුම් (S), බදු (T) සහ ආනයන (M) වලිනි. (ලකුණු 01 යි)

(ii)
- ගොඩනැගිලි සහ ඉදිකිරීම්
- යන්ත්‍රසූත්‍ර සහ උපකරණ
- ප්‍රවාහන උපකරණ
- ඉඩම් සංවර්ධනය සහ වැවිලි සංවර්ධනය

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

විකල්ප පිළිතුර (1) :
- ඉදිකිරීම්
- යන්ත්‍රසූත්‍ර හා යුධමය ආම්පන්න
- ප්‍රවාහන උපකරණ
- තොරතුරු තාක්ෂණ උපකරණ
- වගා කළ ජෛව විද්‍යාත්මක සම්පත්
- බුද්ධිමය දේපළ

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

විකල්ප පිළිතුර (2) :
- නිවාස
- වෙනත් ගොඩනැගිලි සහ ඉදිකිරීම්
- ජදිංචිය සඳහා නොවන ගොඩනැගිලි
- යන්ත්‍රසූත්‍ර සහ උපකරණ
- ප්‍රවාහන උපකරණ
- වගා කළ ජෛව විද්‍යාත්මක සම්පත්
- බුද්ධිමය දේපළ
- නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් (ස්වාභාවික සම්පත්, ගිවිසුම්, බදුකර බලපත්‍ර, කීර්තිනාමය, සන්නාම)

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

(iii)
- දළ දේශීය නිෂ්පාදිතය යනු කිසියම් වර්ෂයක් තුළ ආර්ථිකය විසින් නිෂ්පාදනය කරනු ලබන සියලුම අවසාන භාණ්ඩ හා සේවාවල වෙළඳපොළ වටිනාකම වේ.

- මෙම වටිනාකම ගණනය කිරීමට යොදා ගැනෙන ප්‍රවේශ තුනකි. නිමැවුම් ප්‍රවේශය, ආදායම් ප්‍රවේශය සහ වියදම් ප්‍රවේශය වශයෙනි.

- නිමැවුම් ප්‍රවේශය යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කරනුයේ ගිණුම්කරණ කාල පරිච්ඡේදය තුළ ආර්ථිකය තුළ සිදුවන සියලුම ආර්ථික ක්‍රියාකාරකම් වල දළ එකතු කළ අගය ගණනය කොට එයට නිෂ්පාදිත මත සහ නිෂ්පාදන ක්‍රියාවලිය මත පනවනු ලබන සහනාධාර අඩුකළ බදු (ශුද්ධ බදු) ගැළපීමෙනි.

(ලකුණු 01 යි)

- ආදායම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කරනුයේ අදාළ කාලපරිච්ඡේදය තුළ ආර්ථිකයේ සියලුම ආර්ථික ක්‍රියාකාරකම් නිසා ජනනය වූ සාධක ආදායම් සියල්ල එකතු කොට, එය ශුද්ධ වක්‍ර බදු සහ ක්ෂයවීම් ගැළපීමෙනි. වැටුප්, පොලී, බදු කුලී සහ ලාභ වලින් සාධක ආදායම් සමන්විත වේ.

(ලකුණු 01 යි)

- වියදම් ප්‍රවේශය ඔස්සේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම ගණනය කරනුයේ අදාළ කාලය තුළ බිහිකළ අවසාන නිමැවුම මිලදී ගැනීම සඳහා වැය කරන ලද වියදම් සියල්ල එකට එකතු කිරීමෙනි. ඒ අනුව මුළු නිමැවුමේ වටිනාකම පරිභෝජනය ( C), ආයෝජනය (I), ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) සහ ශුද්ධ අපනයන (NX) යන වියදම් සංරචක වල එකතුවට සමාන වේ.

(ලකුණු 01 යි)

- වෙළෙඳපොළ මිල යටතේ දළ දේශීය නිෂ්පාදිතයේ වටිනාකම සහ ශුද්ධ ජාතික ආදායම් අතර වෙනසට හේතුව (අ) ක්ෂයවීම් හෙවත් ස්ථාවර ප්‍රාග්ධනය පරිභෝජනය සහ (ආ) විදේශීය ශුද්ධ සාධක ආදායම් තිබීම ය.

- ශුද්ධ ජාතික ආදායම = දළ දේශීය නිෂ්පාදිතය - ක්ෂය වීම් + විදේශ ශුද්ධ සාධක ආදායම්

(ලකුණු 01 යි)

(iv) - ව්‍යාපාර චක්‍රයෙහි පතුළට වැටී සිටින ආර්ථිකයක් යළි යථාතත්වය කරා නැඹුරුවීමේ ක්‍රියාවලිය ආර්ථික ප්‍රසාරණය ලෙස දැක්වේ. ව්‍යාපාර චක්‍රයේ මෙම අවධියේ දී ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ නගී. නිමැවුම වැඩි වේ. විරැකියාව පහළ වැටේ. උපයෝජනය නොකළ ධාරිතාවක් සහ සේවා වියුක්ත ශ්‍රමිකයන් සිටින බැවින්, මේ අවධියේ දී නිෂ්පාදනය වඩාත් පහසුවෙන් ප්‍රසාරණය කළ හැකි ය.

- ප්‍රසාරණ අවධියේ දී ප්‍රධාන වශයෙන් සමස්ත ඉල්ලුම ඉහළ යාම නිසා ආර්ථිකයේ පවත්නා නිෂ්පාදන ධාරිතාව උපයෝජනය කිරීමේ සීඝ්‍රතාව ඉහළ නගී.

(ලකුණු 02 යි)

- ආර්ථික වර්ධනය වූ කලී දිගු කාලීන ප්‍රපංචයක් වන අතර, එය සමන්විත වන්නේ ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් කිරීමේ ක්‍රියාවලියකිනි. මින් අදහස් වන්නේ ආර්ථික වර්ධන ක්‍රියාවලියක දී ආර්ථිකයේ විභව නිමැවුම කාලයත්

සමඟ ප්‍රසාරණය වන බවය.

- ආර්ථික වෘද්ධිය බිහි කරන ප්‍රධාන මූලාශ්‍ර දෙකකි. එනම් නිෂ්පාදන සම්පත් සම්භාරය ඉහළ නැංවීම (ප්‍රධාන වශයෙන් ප්‍රාග්ධන සමුච්චනය මගින්) සහ තාක්ෂණය ඉහළ නැංවීම ය. (ලකුණු 02 යි)

(V) - දළ දේශීය නිෂ්පාදිතය (GDP) :

GDP = C+I+G+X-M

GDP = 700+200+300+375-325 (ලකුණු 01 යි)

GDP = රු. බිලියන 1250 (ලකුණු 01 යි)

- පෞද්ගලික වැය කළ හැකි ආදායම ($Y_d$) :

$Y_d$ = GDP - බදු (T) + සංක්‍රාම (Tr) (ලකුණු 01 යි)

$Y_d$ = 1250 - 550 + 300 = රු. බිලියන 1000 (ලකුණු 01 යි)

5. (i) සරල ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය C = 100 + 0.8Y ලෙසත්, ආයෝජනය I = 200 ලෙසත් සලකන්න.
   - (අ) මෙම ආර්ථිකයේ සමතුලිත ආදායම් මට්ටම කොපමණ ද? (ලකුණු 02 යි)
   - (ආ) සමතුලිත අවස්ථාවේ දී ආර්ථිකයේ ඉතුරුම් මට්ටම කොපමණ ද? (ලකුණු 02 යි)
   - (ඇ) කිසියම් හේතුවක් නිසා ආර්ථිකයේ සමාහාර තිබෙදුම් මට්ටම 1 700ක් වුවහොත්, අභිචේතනාත්මක (involuntary) තොග සමුච්චනය කොපමණ ප්‍රමාණයකින් වනු ඇත් ද? (ලකුණු 02 යි)

(ii) රුපියල් මිලියන 500කින් බදු (T) ඉහළ දැමීම නිසා මුළු දළ දේශීය නිෂ්පාදිතයේ සිදුවන පහළ වැටීමට වඩා විශාල වූ පහළ වැටීමක්, රුපියල් මිලියන 500කින් ආණ්ඩුවේ මිළ දී ගැනීම (G) අඩු වූ විට හට ගන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) දළ දේශීය නිෂ්පාදිතය (Y) රුපියල් මිලියන 6 000ක් බවත්, පෞද්ගලික වැය කළ හැකි ආදායම රුපියල් මිලියන 5 100ක් බවත්, ආණ්ඩුවේ අයවැය හිඟය රුපියල් මිලියන 200ක් බවත්, පරිභෝජන වියදම රුපියල් මිලියන 3 800ක් බවත්, වෙළෙඳ ශේෂයේ හිඟය රුපියල් මිලියන 100ක් බවත් සලකන්න.
   - (අ) ඉතුරුම් (S) කොපමණ ද? (ලකුණු 02 යි)
   - (ආ) ආයෝජන මට්ටම (I) කොපමණ ද? (ලකුණු 02 යි)
   - (ඇ) ආණ්ඩුවේ මිළ දී ගැනීම (G) කොපමණ ද? (ලකුණු 02 යි)

(iv) "සමතුලිත ජාතික ආදායම් මට්ටම, පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම් මට්ටමට අවශ්‍යයෙන් ම සමාන නොවේ." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

5. (i) (අ) සමතුලිත ආදායම Y = C + I

Y = 100+0.8Y+200 (ලකුණු 01 යි)

Y = 300+0.8Y

Y - 0.8Y = 300

0.2Y = 300

Y = 1500 (ලකුණු 01 යි)

(ඈ) සමතුලිත අවස්ථාවේ දී ඉතුරුම් මට්ටම :

$$S = Y - C$$

$$S = Y - [100 + 0.8(1500)]$$ (ලකුණු 01 යි)

$$S = 1500 - (100 + 1200)$$

$$S = 1500 - 1300 = 200$$ (ලකුණු 01 යි)

(ඉ) අච්ඡානුගත තොග සමුච්චනය :

- සමතුලිත ජාතික ආදායම් මට්ටම නිරූපණය කරනුයේ මුළු නිමැවුමේ වටිනාකමට සමාහාර වියදම සමාන බව ය. සමාහාර වියදමේ ප්‍රමාණය ඉක්මවා මුළු නිමැවුම වැඩි කරනු ලැබුවහොත්, නිමැවුම මිල දී ගැනීමට අවශ්‍ය කරන ඉල්ලුමේ ඌනතාවක් හට ගනී. ප්‍රමාණවත් ඉල්ලුමක් නොමැති කමින්, අලෙවි නොවූ භාණ්ඩ තොග වශයෙන් සමුච්චනය වේ. මෙලෙස අනිච්ඡානුගත තොග සමුච්චනයේ ප්‍රමාණය නිමැවුමේ වටිනාකම සහ සමාහාර වියදමේ වටිනාකම අතර වෙනසට සමාන වේ. එනම්,

$$1700 - 1500 = 200$$

නිමැවුම - ඉල්ලුම = තොග සමුච්චනය (ලකුණු 02 යි)

(ii) - රුපියල් මිලියන 500 කින් ආණ්ඩුවේ මිල දී ගැනීම් (G) අඩු වූ විට, ඒ හා සමාන ප්‍රමාණයකින් බදු වැඩි වූ විට ඇතිවන බලපෑමට වඩා විශාල වූ ගුණක ප්‍රතිඵල සහිත සංකෝචනාත්මක බලපෑමක් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය මත ඇති වේ. මක්නිසා ද යත් ආණ්ඩුවේ මිල දී ගැනීම් අඩු වූ ප්‍රමාණයෙන් ම සමස්ත වියදමේ සෘජු අඩුවීමක් හටගන්නා බැවිනි. (ලකුණු 02 යි)

- අනික් අතට රුපියල් මිලියන 500 කින් බදු ඉහළ දැමූවිට, ඒ හා සමාන ප්‍රමාණයකින් සමස්ත වියදම සෘජුවම අඩු වන්නේ නැත. මක්නිසාද යත් බදු ඉහළ දැමූවිට එය සමස්ත ඉල්ලුම කෙරෙහි සෘජුවම බලපාන්නේ නැත.

- බදු ඉහළ නැංවූ විට එහි බලපෑම මුලින් ම පතිතවන්නේ, වැය කළ හැකි ආදායම මත ය. සමස්ත ඉල්ලුම කෙරෙහි බලපානුයේ ඉන් අනතුරුව ය. වැය කළ හැකි ආදායම අඩු වූ විට එයට ප්‍රතිචාර දක්වමින් පරිභෝජන වියදම පහළ වැටෙන අතර, ඒ ඔස්සේ ගුණක ප්‍රතිඵල ඇති කරමින් මූර්ත ආදායමේ සංකෝචනය හට ගනී. (ලකුණු 02 යි)

| විකල්ප පිළිතුරක් : | | |
|---|---|---|
| ආණ්ඩුවේ වියදම් ගුණකය ($K_g$) | = | $1/(1-MPC)$ |
| බදු ගුණකය ($K_T$) | = | $MPC/(1-MPC)$ |
| $K_G > K_T$ | | (ලකුණු 02 යි) |

(iii) (අ) - ඉතුරුම් (S) ගණනය කිරීම :

ඉතුරුම් (S) = පෞද්ගලික වැය කළ හැකි ආදායම ($Y_d$) - පරිභෝජන වියදම (S) (ලකුණු 01 යි)

$$S = Y_d - C$$

- $S = 5100 - 3800 = 1300$ (ලකුණු 01 යි)

(ආ) ආයෝජන මට්ටම (I) :

$$S+T+M = I+G+X$$
$$S+T = I+G+(X-M)$$
$$1300+900 = I+1100+(-100)$$ (ලකුණු 01 යි)

$$I = 2200-1000$$
$$= 1200$$ (ලකුණු 01 යි)

(ඉ) - ආණ්ඩුවේ මිලදී ගැනීම (G):

බදු (T) $= Y - Y_d = 6000 - 5100 = 900$

$T = 900$ (ලකුණු 01 යි)

අයවැය හිඟය (BD) $= T - G = 200$

$G = T + 200$

$G = 900 + 200 = 1100$ (ලකුණු 01 යි)

(iv) - ජාතික ආදායම් මට්ටම පවත්නා මට්ටමේ සිට ඉහළ නැඟීමට හෝ පහළ බැසීමට හෝ ප්‍රවණතාවක් නොදක්වන විට, එය සමතුලිත ආදායම් මට්ටමක් ලෙස නිර්වචනය කෙරේ. මේ සමතුලිත තත්වය හටගැනීම සඳහා අවශ්‍ය කරන කොන්දේසිය විකල්ප ප්‍රවේශ දෙකක් ඔස්සේ පෙන්නුම් කළ හැකිය. එනම්,

(i) සැලසුම් කළ වියදම් සැමැ නිමැවුමේ වටිනාකමට සමාන වීම, $Y = E$ (ආදායම් - වියදම් ප්‍රවේශය)

(ii) වියදම් ප්‍රවාහයේ විදීම් හා කාන්දුවීම් එකිනෙකට සමාන වීම, $W = J$ (කාන්දුවීම් - විදීම් ප්‍රවේශය)

(ලකුණු 02 යි)

- සමතුලිත ජාතික ආදායම සහ පූර්ණ සේවා නියුක්ති ජාතික ආදායම යනු එකම දෙයක් නොවන බව, මෙහි දී විශේෂයෙන් සැලකිය යුතුය. පූර්ණ සේවා නියුක්ති ආදායම් මට්ටම යනු ආර්ථිකයේ සියලුම සම්පත් පූර්ණ වශයෙන් උපයෝජනය කළ විට, ලබා ගන්නා ආදායම් මට්ටමයි. සමතුලිත ජාතික ආදායම් මට්ටම හැම විටම පූර්ණ සේවා නියුක්ති ආදායමට අනුගතව ස්ථාපිත වේ යයි සහතිකයක් නොමැත. පූර්ණ සේවා නියුක්ති මට්ටමේ හෝ පූර්ණ සේවා නියුක්ති මට්ටමට වඩා පහළින් හෝ ඊට වඩා ඉහළින් හෝ සමතුලිත ආදායම් මට්ටම තීරණය විය හැකි ය. ඒ සඳහා අවශ්‍ය කොන්දේසිය වන්නේ හුදෙක් නිමැවුමේ වටිනාකමට සමාන වියදමක් ($Y = E$) හටගැනීම හෝ කාන්දුවීම් හා විදීම් සමාන වීම ($W = J$) හෝ පමණි.

(ලකුණු 02 යි)

'ආ' උප කොටස

(මෙම කොටසින් ද අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න.)

6. (i) මතුපිට උද්ධමනය සහ මූලික උද්ධමනය අතර වෙනස දක්වන්න. (ලකුණු 04 යි)

(ii) සමාහාර වියදමේ සංරචක හඳුනාගෙන, ආර්ථිකයක සමාහාර වියදම ඉහළ යාමක් නිසා උද්ධමනයක් හටගත හැක්කේ කෙසේ ද යන්න ප්‍රස්තාර සටහනක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) වාණිජ බැංකුවක ශේෂ පත්‍රයක් පහත දැක්වේ.

| වගකීම් | වටිනාකම (රුපි. මිලියන) | වත්කම් | වටිනාකම (රුපි. මිලියන) |
|---|---|---|---|
| තැන්පතු | 180 000 | සංචිත | 100 000 |
| | | භාණ්ඩාගාර බැඳුම්කර | 40 000 |
| | | ණය | 40 000 |
| **මුළු වගකීම්** | **180 000** | **මුළු වත්කම්** | **180 000** |

(අ) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය 10%ක් වේ නම්, මෙම බැංකුවට අනාගතයේ දී ලබා දිය හැකි අමතර ණය උපරිම වශයෙන් කොපමණ වේ ද? (ලකුණු 02 යි)

(ආ) රුපියල් මිලියන 10 000ක තැන්පතු මෙම බැංකුවෙන් ඉවත් කර ගනු ලැබුවහොත්, එම බැංකුවට අනාගතයේ දී ලබා දිය හැකි අමතර ණය උපරිම වශයෙන් කොපමණ වේ ද? (ලකුණු 02 යි)

(iv) අධිබලැති මුදල් යන්නෙන් අදහස් වන්නේ කුමක් ද? ආර්ථිකයේ අධිබලැති මුදල් තොගය පාලනය කිරීමෙහිලා පරිපූර්ණ බලයක් මහ බැංකුවට තිබේ ද? හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(v) ශ්‍රී ලංකා මහ බැංකුව වර්තමානයේ අනුගමනය කරනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

6. (i)

- මතුපිට උද්ධමනය යනු පාරිභෝගික මිල දර්ශකයෙන් මනිනු ලබන කිසිදු ගැළපීමකට හෝ සංශෝධනයකට යටත් නොවූ, ආර්ථිකයේ සැබෑ මිල ගණන්වල ඉහළයාමකි. එමගින් යම් දෙන ලද කාලයක් තුළ ආර්ථිකයේ සියලුම පාරිභෝගික භාණ්ඩ හා සේවාවන්ගේ මිල කොතරම් ප්‍රමාණයකින් ඉහළගොස් තිබේදැයි දැනගත හැකි වේ.

- කිසියම් ප්‍රදේශයක ජීවන වියදම කොතරම් ප්‍රමාණයකින් ඉහළ ගොස් තිබේද යන්න මතුපිට උද්ධමන අනුපාතිකයෙන් මනිනු ලැබේ. ජීවන වියදමේ වෙනස්කම් එමගින් පිළිබිඹු වන නිසා සාමාන්‍ය ජනතාවට එම මිනුම වඩාත් ප්‍රයෝජනවත් වේ.

- ආහාර සහ බලශක්ති මිල වැනි දැඩිව උච්චාවචනයන් ට පාත්‍රවන මිල ගණන්, මතුපිට උද්ධමන අනුපාතිකය තුළ ඇතුළත් වන බැවින්, යටිදැරි උද්ධමනයේ ස්වභාවය එමගින් නිවැරදිව පිළිබිඹු නොවේ. (ලකුණු 02 යි)

- මූල්‍ය අධිකාරියේ පාලනයකින් තොරව සිදුවන, කාලගුණ වෙනස්කම්, බාහිර ලෝකයේ සිදුවන වෙනස්කම්, බදු ප්‍රතිපත්තියේ වෙනස්කම්, මිල පාලනයන්, සැපයුම් කම්පන වැනි හේතු කරන කොට හටගන්නා ආහාර හා බලශක්ති මිල ගණන් වල වෙනස්කම් නිසා, මතුපිට උද්ධමන අනුපාතිකය තාවකාලික උච්චාවචනයන්ට පාත්‍ර වේ.

- ලෝකයේ බොහෝ රටවල මූල්‍ය ප්‍රතිපත්ති සම්පාදකයන් මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ තීරණය ගනු ලබන්නේ, පාරිභෝගික මිල දර්ශකයෙන් තාවකාලික මිල වෙනස්කම් ඉවත් කළ පසු ශේෂ වන උද්ධමනයේ යටිදැරි ප්‍රවණතාවන් අධ්‍යයනය කරමිනි.

මෙලෙස උද්ධමනයේ යථාර්ථ ප්‍රවණතා හඳුනාගැනීම සඳහා තාවකාලික මිල වෙනස්කම් බැහැර කරමින් සකසනු ලබන උද්ධමන අනුපාතිකය මූලික උද්ධමනය වශයෙන් හඳුන්වනු ලැබේ. (ලකුණු 02 යි)

(ii) - සමාහාර වියදමේ සංරචක :

පරිභෝජන වියදම (C)


ආයෝජන වියදම (I)

ආණ්ඩුවේ මිල දී ගැනීම (G)

ශුද්ධ අපනයන (NX) (ලකුණු 02 යි)

- ආර්ථිකයේ සමාහාර වියදම් ඉහළ යන විට සමාහාර ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වේ. සමාහාර සැපයුම නොවෙනස්ව තිබිය දී සමාහාර ඉල්ලුම වැඩි වන විට ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය සක්‍රීය වේ. (ලකුණු 01 යි)

- මෙම තත්වය රූප සටහනෙහි මැනවින් පෙන්නුම් කෙරේ.




සමාහාර සැපයුම් වක්‍රය AS වශයෙන් දක්වා ඇත. සමාහාර ඉල්ලුම $AD_1$ සිට $AD_2$ දක්වා වැඩිවන විට ආදායම් මට්ටම $Y_2$ දක්වාත් මිල මට්ටම $P_2$ දක්වාත් ඉහළ නගී.

(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 01 යි)

(iii) (අ) - බැංකුවට උපරිම වශයෙන් ලබාදිය හැකි අළුත් ණය ප්‍රමාණය රඳා පවතින්නේ බැංකුව සතු අධිසංචිත ප්‍රමාණය මතය. අධි සංචිතයේ ප්‍රමාණයට සමානව අළුත් ණය ලබාදිය හැකි ය.

- පවත්නා සංචිතයේ ප්‍රමාණය : = 100,000

තැන්පතු සඳහා අවශ්‍යකරන සංචිතයේ ප්‍රමාණය = 180,000 × 0.10 = 18,000

අධි සංචිතයේ ප්‍රමාණය

= 100,000 - 18,000 = 82,000

(ලකුණු 02 යි)

(ආ) රුපියල් මිලියන 10,000 ක තැන්පතු බැංකුවෙන් ඉවත් කරගත් විට, ලබාදිය හැකි උපරිම ණය ප්‍රමාණය තවදුරටත් අධි සංචිතයේ ප්‍රමාණයටම සමාන වනු ඇත.

| | | | | |
|---|---|---|---|---|
| දැනට පවත්නා සංචිතයේ ප්‍රමාණය | = | 100,000 - 10,000 | = | 90,000 |
| දැනට පවත්නා තැන්පතු ප්‍රමාණය | = | 180,000 - 10,000 | = | 170,000 |
| අවශ්‍ය කරන සංචිතයේ ප්‍රමාණය | = | 170,000 × 0.1 | = | 17,000 |
| අධි සංචිතයේ ප්‍රමාණය | = | 90,000 - 17,000 | = | 73,000 |
| උපරිම වශයෙන් ලබාදිය හැකි අළුත් ණය ප්‍රමාණය | | | = | 73,000 |

(ලකුණු 02 යි)

(iv) - කිසියම් රටක සමස්ත මුදල් සැපයුමේ පදනම ලෙස සැලකෙන මූල්‍ය වත්කම්, අධිබලැති මුදල් ලෙස හඳුන්වනු ලැබේ. මේවා සංචිත මුදල් හා පදනම් මුදල් යන නම් වලින් ද හැඳින්වේ. රටේ මූල්‍ය සමස්තයන් ගොඩනැගෙනුයේ අධිබල මුදල් තොගය මතය. එබැවින් එය රටක මුදල් සැපයුමේ ප්‍රධාන නිශ්චායකයක් වන්නේය.

(ලකුණු 01 යි)

- අධි බල මුදල් සමන්විත වනුයේ
  - (අ) මහජනයා හා වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය සහ
  - (ආ) වාණිජ බැංකු සතුව මහ බැංකුවේ ඇති තැන්පතු ප්‍රමාණය යන ප්‍රධාන සංරචක දෙකෙනි. (ලකුණු 01 යි)

- අධි බලැති මුදල් මහ බැංකුවේ සිට ආර්ථිකය කරා මුදාහරින ප්‍රධාන යන්ත්‍රණයන් දෙකකි. මින් එක් යන්ත්‍රණයක් වනුයේ මහ බැංකුව විසින් රජයට සහ වාණිජ බැංකුවලට ණය සැපයීම ඔස්සේ දේශීය මූල්‍ය වත්කම් අත්කර ගැනීම ය. අනික් යන්ත්‍රණය වනුයේ මහ බැංකුව රජයෙන් සහ වාණිජ බැංකු වලින් විදේශ විනිමය මිල දී ගැනීම ය. (ලකුණු 01 යි)

- මෙම තත්වය යටතේ ආර්ථිකයේ අධිබලැති මුදල් තොගය පාලනය කිරීමේලා පරිපූර්ණ බලයක් මහ බැංකුවට නොමැත. රජයේ බැංකු කරුවා වශයෙන් ආණ්ඩුවේ වියදම් පියවා ගැනීම අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීමට මහ බැංකුවට සිදුවේ.

- එසේම විදේශ විනිමය අනුපාතිකයේ උච්චාවචන වළක්වා ගැනීමවස් විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත් වීමට මහ බැංකුවට සිදුවේ.

(ලකුණු 01 යි)

(v) මූල්‍ය ප්‍රතිපත්ති රාමුවේ ප්‍රධාන අරමුණු :

- මුදල් ඉලක්කකරණය සහ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණය යන ද්විත්වයෙහිම ලක්ෂණ සහිතව, වැඩි දියුණු කළ මූල්‍ය ප්‍රතිපත්ති රාමුවක් මත පදනම් වී, ශ්‍රී ලංකා මහ බැංකුව සිය මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරයි.

- මෙම වැඩි දියුණු කළ මූල්‍ය ප්‍රතිපත්ති රාමුව යටතේ, වර්ධන අරමුණු වලට සහ විනිමය අනුපාතික කළමනාකරණයේ නම්‍යශීලීත්වයට සහාය දෙන අතරම, මැදි කාලීනව උද්ධමනය මැදි තනි අගයක පවත්වා ගැනීමට මහ බැංකුව අරමුණු කරයි.

- සංචිත මුදල් තවදුරටත් මෙහෙයුම් ඉලක්කයක් නොවුණ ද, මූල්‍ය ප්‍රතිපත්තියට මගපෙන්වීම සඳහා ඇති ප්‍රධාන අතරමැදි දර්ශකයක් ලෙස පුළුල් මුදල් සැපයුම ($M_2b$) යොදා ගනී.

- වර්තමානයේ ශ්‍රී ලංකා මහ බැංකුව සිය මෙහෙයුම් ඉලක්කය ලෙස සංචිත මුදල් වෙනුවට බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (Average weighted call money rate - AWCMR) භාවිත කරනු ලබන අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සහ විවෘත වෙළෙඳපොළ කටයුතු වැනි වෙළෙඳපොළ මත පදනම් වූ ප්‍රතිපත්ති උපකරණ මත වැඩි වශයෙන් විශ්වාසය තබා ඇත.

(ඕනෑම එක් කරුණකට ලකුණු 02 බැගින් ලකුණු 04 යි)

7. (i) ශුද්ධ පොදු භාණ්ඩයක් යනු කුමක් ද? අර්ධ පොදු භාණ්ඩයකින් එය වෙනස් වන්නේ කෙසේ ද? (ලකුණු 04 යි)

(ii) නිදහස් වෙළෙඳපොළක් සෘණ බාහිරතා සහිත භාණ්ඩවල අධි නිෂ්පාදනයක් ඇති කරනුයේ ඇයි? යෝග්‍ය ප්‍රස්තාර සටහනක් යොදා ගනිමින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ශ්‍රී ලංකාවේ භාණ්ඩ බදු (excise taxes) අයභාරයේ ප්‍රධාන මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 04 යි)

(iv) "ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කටයුතු සංදිග්ධ තත්ත්වයක පවතී" (ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය). ශ්‍රී ලංකාවේ වර්තමාන රාජ්‍ය මූල්‍ය තත්ත්වයේ දක්නට ඇති ප්‍රධාන දුර්වලතා හඳුනාගන්න. (ලකුණු 04 යි)

(v) රාජ්‍ය මූල්‍ය ක්ෂේත්‍රයේ බරපතල ගැටලු විසඳීමේලා ශ්‍රී ලංකා රජය මෑත කාලයේ දී ගෙන ඇති වැදගත් ක්‍රියාමාර්ග සැකෙවින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

7. (i)


- පරිභෝජනයේ තරඟකාරිත්වයක් නොමැති සහ පරිභෝජනය සීමාකළ නොහැකි භාණ්ඩ ශුද්ධ පොදු භාණ්ඩ වේ. (ලකුණු 02 යි)

- අර්ධ පොදු භාණ්ඩවල ලක්ෂණය වනුයේ ධාරිතා මට්ටම කරා ළඟාවන තුරු පරිභෝජනයේ තරඟකාරිත්වයක් දක්නට නොතිබීමත්, පරිභෝජනය සීමා කිරීමේ හැකියාවක් තිබීමත් ය. (ලකුණු 02 යි)

(ii)

- නිෂ්පාදනයේ සෘණ බාහිරතා පවතින විට නිෂ්පාදනයේ සමාජ පිරිවැය, පෞද්ගලික පිරිවැය ඉක්මවා යයි. එවැනි තත්ත්වයක් පවතින විට නිදහස් වෙළෙඳපොළ සමතුලිත නිමැවුම, සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම මට්ටම ඉක්මවා යන අතර, අධි නිෂ්පාදනයක් හට ගනී. (ලකුණු 02 යි)

- මෙම තත්වය ප්‍රස්තාර සටහනක් යොදා ගනිමින් පැහැදිලි කළ හැකිය.




- නිදහස් වෙළෙඳපොළ සමතුලිත නිමැවුම = $Q$
  සමාජයීය වශයෙන් ප්‍රශස්ත නිමැවුම = $Q_1$
  අධි නිෂ්පාදන ප්‍රමාණය = $Q - Q_1$

(නිවැරදි ප්‍රස්තාරයට ලකුණු 02 යි)

**විකල්ප පිළිතුර :**
- පරිභෝජන ක්‍රියාවලියක සෘණ බාහිරතා දක්නට ලැබෙන විට පෞද්ගලික ප්‍රතිලාභ (MPB) සමාජයීය ප්‍රතිලාභ (MSB) ඉක්මවා යයි. එවැනි තත්වයක දී නිදහස් වෙළෙඳපොළ සමතුලිත ඉල්ලුම (නිමැවුම), සමාජයීය වශයෙන් ප්‍රශස්ත ඉල්ලුම (නිමැවුම) මට්ටම ඉක්මවා යනු ඇත. එමනිසා එවැනි භාණ්ඩයක අධි පරිභෝජනයක් නැතහොත් අධි නිෂ්පාදනයක් සිදුවේ. (ලකුණු 02 යි)

- මෙම තත්වය සරල ප්‍රස්තාර සටහනක් මගින් පැහැදිලි කළ හැකිය.




- නිදහස් වෙළෙඳපොළ සමතුලිත ඉල්ලුම (නිමැවුම) = Qm
- සමාජයීය වශයෙන් ප්‍රශස්ත පරිභෝජනය = Qs
- අධි නිෂ්පාදනය = Qm - Qs

(නිවැරදි රූප සටහනට ලකුණු 02 යි)

(iii) - ප්‍රධාන භාණ්ඩ බදු මූලාශ්‍ර :
  - සිගරට්
  - මත්පැන්
  - පෙට්‍රෝල්
  - මෝටර් රථ (එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(iv) - පුළුල් වන අයවැය පරතරයත්, සමග ඉහළ වූ රාජ්‍ය ණය සමුච්චයත් නිසා ණය සේවාකරණ බර ඉහළ හගිමින් පවතී.

- 2016 වර්ෂයේ දී පවත්නා ණය තොගයට පොලී ගෙවීම සඳහා මුළු රාජ්‍ය ආදායමෙන් 36.2% ක් අවශෝෂණය වූ අතර, ණය වාරික ගෙවීම සඳහා රාජ්‍ය ආදායමෙන් තවත් 44% ක් වැය විය. මේ අනුව මුළු රාජ්‍ය ආදායමෙන් 80.2% ක් ණය සේවාකරණය සඳහා අවශෝෂණය විය.

- ශ්‍රී ලංකාවේ බදු ආදායමේ විශාලතම මූලාශ්‍රය වී ඇත්තේ වක්‍ර බදු ය. වසර

ගණනාවක් තිස්සේම සෘජු බදුවල දායකත්වය නොවෙනස්ව පහත් මට්ටමක පවතී.

- දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය අයභාරය 2000 වර්ෂයේ දී 17% ක් ව පැවැතිය ද 2014 වර්ෂය වන විට 11.5% ක් දක්වා පහළ වැටී තිබිණි.

- වර්තමානයේ විවිධ නෛතික ව්‍යුහයක් යටතේ ස්ථාපිත කරන ලද රාජ්‍ය ව්‍යවසායන් 245 ක් දක්නට ලැබේ. මේවා අතරින් අක්‍රියව පවත්නා සහ පාඩු ලබමින් පවත්නා ආයතන, තම පුනරාවර්තන වියදම් පියවා ගැනීමට අයවැය ලේඛනය මත යැපෙමින් සිටී. මේවා අතුරෙන් ආයතන 55 ක් උපාය මාර්ගික වැදගත් කමක් උසුලන රාජ්‍ය ව්‍යවසායන් ලෙස රජය හඳුනාගෙන ඇත. ඒවා අතුරින් ආයතන 11 ක් අති විශාල පාඩු ලබමින් සිටී. මේවා බලශක්ති, ගුවන්, මගී ප්‍රවාහන සහ ව්‍යාපාරික වතු වැනි වාණිජ පදනමින් පවත්වාගෙන යන ව්‍යාපාරයන් ය.

- ආණ්ඩුවේ වියදම් වල දැඩි දෘඪතාවක් දක්නට ලැබේ. ආණ්ඩුවේ පුනරාවර්තන වියදමින් 86% ක් ම සමන්විත වී ඇත්තේ, පොලී ගෙවීම්, වැටුප් ගෙවීම් සහ කුටුම්බ පැවැරුම් වැනි පහසුවෙන් අඩුකළ නොහැකි අනම්‍යශීලී වියදම් වලිනි.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරකට ලකුණු 04 යි)

(v) - 2016 වසර සඳහා වූ අයවැය ලේඛනය මගින් රජයේ ආදායම ඉහළ නැංවීමේ අරමුණින් ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙනු ලැබීය. ඒ අනුව බදු පදනම පුළුල් කරන අතරම, බදු ක්‍රමය සරල කිරීම හා බදු පරිපාලනය කාර්යක්ෂම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී.

- අයවැය හිඟය අඩු කිරීමට පියවර ගනු ලැබ ඇත. 2015 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 7.6% ක් වූ සමස්ත අයවැය හිඟය 2016 වර්ෂයේ දී 5.4% දක්වා අඩු කරගනු ලැබීය. 2020 වන විට සමස්ත අයවැය හිඟය 3.5% ක් දක්වා අඩුකර ගැනීමට අපේක්ෂා කරයි.

- මැදි කාලීනව බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 15 - 16% ක් පමණ මට්ටමක් දක්වා වැඩි කිරීම සඳහා බදු පදනම පුළුල් කිරීමටත්, බදු නිදහස් කිරීම, බදු විරාම සහ සාධාරණය සහ ඵලදායි බදු පරිපාලනයට අහිතකර වූ විශේෂිත බදු අනුපාතික අවම කිරීම මගින් බදු පද්ධතිය තාර්කිකරණය කිරීමටත්, පියවර ගෙන ඇත.

- ආදායම ඉහළ නැංවීම සහ බදු පදනම පුළුල් කිරීමේ අරමුණ ඇතිව එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැංවීමේ බදු සඳහා සංශෝධන කීපයක් හඳුන්වාදෙන ලදී.

- කාණ්ඩ තුනකින් යුත් තීරුබදු ව්‍යුහයක් හඳුන්වා දීම මගින් ආනයන බදු ව්‍යුහය තාර්කිකරණය කරන ලද අතර, තෝරාගත් අයිතම සඳහා තීරුබදු අනුපාතික ඉහළ නංවන ලදී.

- බදු පරිපාලනය වැඩි දියුණු කිරීම සහ ආදායම ඉහළ නැංවීම සඳහා ආදායම්


එක්රැස් කරනු ලබන ආයතන වල කටයුතු පරිගණක ගත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට පියවර ගෙන ඇත. ආදායම් බදු, එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු, රඳවා ගැනීමේ බදු සහ PAYE බදු සඳහා අන්තර් ජාලය (RAMIS) ඔස්සේ බදු වාර්තා පියවීමට ඉඩ සලසනු ලැබ ඇත.

- යටිතල පහසුකම් සංවර්ධනයේදී රාජ්‍ය අයවැය මත පීඩනය අඩු කර ගැනීම සඳහා රාජ්‍ය - පෞද්ගලික හවුල් කාරිත්ව (PPP) දිරිමත් කිරීමට රජය යොමු වී සිටී.

- පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිසංවිධානය කිරීමට යොමු වී සිටී.

(ඕනෑම එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

8. (i) ජංගම දුරකථන සහ පා පැදි නිෂ්පාදනය කරනු ලබන A සහ B යන රටවල් දෙකෙහි නිෂ්පාදන හැකියා වක්‍ර පහත රූපසටහනෙහි දැක්වේ.




(අ) එක් එක් රටෙහි පා පැදියක් නිෂ්පාදනය කිරීමේ ආවස්ථික පිරිවැය කොපමණ ද? (ලකුණු 02 යි)

(ආ) ජංගම දුරකථන නිෂ්පාදනයේ සාපේක්ෂ වාසි ඇත්තේ කවර රටකට ද? (ලකුණු 02 යි)

(ඇ) දෙරටට ම වෙළඳාමෙන් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ජංගම දුරකථන හා පා පැදි අතර හුවමාරු අනුපාතය කුමක් විය යුතු ද? (ලකුණු 02 යි)

(ii) "පසුගිය දශක දෙක තුළ කලාපයේ අනෙකුත් සාමාජික රටවල් හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ කාර්ය සාධනය පහළ මට්ටමක පවතී." ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයේ කාර්ය සාධනය දුර්වල තත්ත්වයක පැවතීමට බලපා ඇති හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(iii) කිසියම් ආර්ථිකයක පොදු මිල මට්ටමේ සැලකිය යුතු ඉහළ යාමක් එරට ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම කෙරෙහි කෙසේ බලපානු ලැබේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) 'බාහිර පරායත්තතාව' යන්නෙන් කුමක් අදහස් වන්නේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(v) යුරෝපා සංගමය කරා යොමු වන ශ්‍රී ලංකා අපනයන සඳහා ජී එස් පී ප්ලස් (GSP+) තීරු බදු සහනය නැවත ලබාදීම නිසා ලැබිය හැකි ප්‍රතිලාභ කවරේ දැයි කෙටියෙන් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

8. (i) (අ) A රටෙහි : පාපැදියක ආවස්ථික පිරිවැය

ජංගම දුරකථන 3 කි.

පාපැදි 400 : දුරකථන 1200

1 : 3 (ලකුණු 01 යි)

B රටෙහි : පාපැදියක ආවස්ථික පිරිවැය :

ජංගම දුරකථන 1 කි.

පාපැදි 600 : දුරකථන 600

1 : 1 (ලකුණු 01 යි)

(ආ) ජංගම දුරකථන නිෂ්පාදනයේ සාපේක්ෂ වාසි :

A රට : ජංගම දුරකථන 1200 : පාපැදි 400

ජංගම දුරකථන 1 : පාපැදි 1/3

B රට : ජංගම දුරකථන 400 : පාපැදි 400

ජංගම දුරකථන 1 : පාපැදි 1

(ආවස්ථික පිරිවැය ගණනයට ලකුණු 01 යි)

- මේ අනුව ජංගම දුරකථන සඳහා සාපේක්ෂ වාසිය ඇත්තේ අඩුම ආවස්ථික පිරිවැය සහිත A රටට ය. (ලකුණු 01 යි)

(ඇ) වාසිදායක හුවමාරු අනුපාතය :

A රට : පාපැදි 1 : දුරකථන 3 (අභ්‍යන්තර හුවමාරු අනුපාතය)

B රට : පාපැදි 1 : දුරකථන 1 (අභ්‍යන්තර හුවමාරු අනුපාතය)

මේ අනුව අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක හුවමාරු අනුපාතය වනුයේ :

පාපැදි 1 = දුරකථන 1 - 3 (1 ට වඩා වැඩි සහ 3 ට වඩා අඩු)

ජංගම දුරකථන 1 = පාපැදි 1/3 – 1 (1/3 ට වඩා වැඩි සහ 1 ට වඩා අඩු)

(ඕනෑම එක් විනිමය අනුපාතයක් සඳහා ලකුණු 02 යි)

(ii) - අපනයන නිෂ්පාදිත විවිධාංගකරණය වී ඇත්තේ අතිශය සීමිත ආකාරයකටය. තේ සහ ඇඟලුම් යන සාම්ප්‍රදායික නිෂ්පාදිත දෙකක් මත අපනයන ව්‍යුහය සංකේන්ද්‍රණය වී පවතී. මුළු අපනයන ප්‍රමාණයෙන් අඩකට වැඩි ප්‍රමාණයක් සඳහා මෙම නිෂ්පාදිත දෙක වගකියයි.

- අපනයන වෙළඳපොළවල් ද ප්‍රමාණවත් ලෙස විවිධාංගකරණය නොමැත. යුරෝපය සහ ඇමෙරිකා එක්සත් ජනපදය මුළු ප්‍රමාණයෙන් 2/3 කට වගකියයි. එලෙසම තේ අපනයන ප්‍රමාණයෙන් 70% කට වැඩි ප්‍රමාණයක් යොමු වී ඇත්තේ මැද පෙරදිගට සහ රුසියාවට ය.

- අපනයනාභිමුඛ කර්මාන්තයන්හි ප්‍රමාණවත් ආයෝජනයක් සිදු නොවීම : නැගෙනහිර ආසියාවේ නව කාර්මික රටවල අපනයන ප්‍රවර්ධනයේ දී සෘජු විදේශ ආයෝජන ඉතා ප්‍රබල කාර්ය භාරයක් ඉටු කරන ලදී. එහෙත් මේ ක්ෂේත්‍රය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට ශ්‍රී ලංකාව අසමත්ව සිටී. ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන ගලා ඒනුයේ අතිශය සීමාසහිත ප්‍රමාණයකිනි. එම ආයෝජන ද වැඩි වශයෙන් යොමුව ඇත්තේ යටිතල පහසුකම් සහ සේවා සැපයීම අංශයන් වෙත ය.

- තේ අපනයන අංශයේ ඉහළ පිරිවැය සහ අඩු ඵලදායිතාව කැපී පෙනේ. තේ නිෂ්පාදනය කරන සෙසු රටවල් සමඟ බලන විට ශ්‍රී ලංකාවේ නිෂ්පාදන පිරිවැය ඉතා ඉහළ ය.

- ශ්‍රම හමුදාව අඩු වීම හා ශ්‍රම පිරිවැය ඉහළ යාම : තේ කර්මාන්ත අංශයේ ශ්‍රමය රඳවා ගැනීම විශාල අභියෝගයක් වී ඇත. තේ කර්මාන්තයේ නියැළී

කම්කරුවන්ගේ සමාජ තත්වය පහත මට්ටමක තිබීමත්, තරුණ පරපුර අධ්‍යාපන මට්ටමින් ඉහළට යාමත්, ඔන් වතුවලින් පිටත වඩාත් ආකර්ශනීය රැකියා අවස්ථා තිබීමත් මේ තත්වයට ප්‍රධාන වශයෙන් බලපා ඇත.

- අපනයන ප්‍රවර්ධනය සඳහා ස්ථාපිත කොට ඇති ප්‍රධාන රාජ්‍ය ආයතනය වන්නේ අපනයන සංවර්ධන මණ්ඩලයයි. මෙම ආයතනයේ දුබලතා රැසකි. අපනයන ප්‍රවර්ධනය සඳහා උපාය මාර්ගික දැක්මක් නොතිබීම, අපනයන ප්‍රවර්ධනය සඳහා සම්පත් ප්‍රමාණවත්ව නොතිබීම, අපනයන ප්‍රවර්ධන ක්‍රියාකාරකම් අධීක්ෂණය දුර්වල වීම, අපනයන ප්‍රවර්ධනය සඳහා ප්‍රතිලාභීන් ඉලක්ක ගත නොවීම ඒ අතර ප්‍රධාන වේ.

(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(iii) - පොදු මිල මට්ටමේ සැලකිය යුතු ඉහළයාමක් නිසා අපනයන නිෂ්පාදිකයන්ගේ දේශීය මිල ගණන් ඉහළ යනු ඇත. පවත්නා විනිමය අනුපාතිකය යටතේ විදේශීය වෙළෙඳපොළවල අපනයන මිල ඉහළ නගින අතර, අපනයන සඳහා නම්‍ය ඉල්ලුමක් පවතිතැයි උපකල්පනය කරනු ලැබුවහොත්, අපනයන පරිමාව (ඉල්ලුම් ප්‍රමාණය) පහළ වැටෙනු ඇත. එහිදී අපනයන මිල වැඩි වූ ප්‍රතිශතය ඉක්මවා අපනයන පරිමාව අඩු වන බැවින්, ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමේ අපනයන ඉපයීම් පහළ වැටෙනු ඇත.

- පොදු මිල මට්ටම ඉහළ යාමක දී අපනයන භාණ්ඩ පමණක් නොව වෙළෙඳාමට පාත්‍ර නොවන භාණ්ඩ වලද දේශීය මිල ගණන් ඉහළ යන අතර, ආනයනික භාණ්ඩ වල දේශීය මිලෙහි කිසිදු වෙනසක් නොසිදු වුව ද, සාපේක්ෂ වශයෙන් ආනයනික භාණ්ඩ දේශීය භාණ්ඩ වලට වඩා ලාභ දායක වනු ඇත. එබැවින් ආනයන පරිමාව සහ ආනයන වියදම් ඉහළ යාම නිසා, ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම මත අයහපත් පීඩනයක් හටගනී.

- දේශීය ආර්ථිකයේ සැලකිය ප්‍රමාණයක උද්ධමන පීඩනයක් හටගෙන ඇති විට පවත්නා විනිමය අනුපාතිකය යටතේ අපනයන පරිමාව පහළ වැටීමට හා ආනයන පරිමාව ඉහළ නැඟීමට නැඹුරුතාවක් ඇති වේ. මින් අදහස් වන්නේ පවත්නා විනිමය අනුපාතිකය යටතේ විදේශ විනිමය වෙළෙඳපොළෙහි දේශීය මුදල් සැපයුම වැඩිවන (ආනයන ඉල්ලුම වැඩි වීම නිසා) බවත් දේශීය මුදලට ඇති ඉල්ලුම අඩුවන (අපනයන ඉල්ලුම අඩුවීම නිසා) බවත් ය. මෙහි ප්‍රතිඵලය වනුයේ දේශීය මුදල් ඒකකයේ බාහිර වටිනාකම ක්ෂයවීමය. මෙහි ප්‍රතිඵල වශයෙන් දිගු කාලයේදී ගෙවුම් ශේෂයේ ජංගම ගිණුම මත වාසිදායක බලපෑමක් හටගත හැකිය. එහෙත් අවසාන වශයෙන් එය රඳාපවතිනුයේ මාර්ෂල් - ලර්නර් කොන්දේසිය කොතෙක් දුරට ඉටුවේද යන්න මතය.

(එක් කරුණකට ලකුණු 02 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 04 යි)

(iv) - ඕනෑම රටක ආර්ථික ප්‍රතිපත්තියේ මූලික අභිලාශයක් වනුයේ ගෙවුම් ශේෂය සහ විදේශ මූල්‍ය කටයුතු වල තිරසාර භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා බාහිර ස්ථායීතාව සාක්ෂාත් කර ගැනීම ය.

- ආනයන වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් අපනයන ඉපයීම් ප්‍රමාණයක් අත්කර ගත හැකි නම්, බාහිර ස්ථායිතාව ආරක්ෂා කර ගත හැකියි. එවැනි තත්වයක් ඇතිවිටක විනිමය අනුපාතිකයේ උච්චාවචන වළක්වා ගනිමින්, මැදි කාලීනව හා දිගුකාලීන විදේශ වගකීම් පහසුවෙන් මුදාහැරිය හැකිය.

- නිල විදේශ විනිමය සංචිත භාවිතයකින් තොරව සමස්ත ගෙවුම් ශේෂය තුලනය කරගත් විට බාහිර ස්ථායිතාව තහවුරු වේ.

- බාහිර ස්ථායිතාව මිනුම් කෙරෙන සෘජු මිනුමක් දක්නට නොමැත. රටක විදේශ ආර්ථික ක්‍රියාකාරකම් වල ස්වභාවය නිරූපණය කෙරෙන පහත සඳහන් දර්ශක ඒ ඒ සඳහා යොදා ගත හැකි ය.

  (i) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ජංගම ගිණුම් හිඟය.

  (ii) දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ශුද්ධ විදේශ වගකීම් සහ

  (iii) විදේශ විනිමය අනුපාතිකය යනාදිය යි.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(v) - මෑත කාලයේ විශාල පසුබෑමකට ලක්ව තිබූ ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂේත්‍රයට යුරෝපා සංගමය මගින් ලබාදෙන විශේෂ ප්‍රතිලාභ සහිත වෙළෙඳවරණයක් පිළිබඳ පොදුක්‍රමය (ජී.එස්.පී. ප්ලස් සහනය) නැවත ලබාදීම අතිශය සහනදායක කරුණක් විය. මෙම සහනය නිසා රෙදිපිළි, කුඩා යන්ත්‍රෝපකරණ, ධීවර නිෂ්පාදන ඇතුළු විශාල පරාසයකට වැටෙන ශ්‍රී ලාංකික නිෂ්පාදිත 1200 කට ආසන්න ප්‍රමාණයක් කිසිදු තීරු බද්දකින් තොරව යුරෝපා සංගමයට අපනයනය කිරීමට අවස්ථාව උදා වී ඇත.

- 2010 - 15 යුරෝපා සංගමයට යොමු වූ ශ්‍රී ලංකා අපනයන වර්ධනය වූයේ 1.02% තරම් වූ නොවැදගත් ප්‍රමාණයකිනි. ජී.එස්.පී. ප්ලස් සහනය අහිමිවීමත් සමග ශ්‍රී ලංකාවේ අපනයන මත තීරු බදු පැනවීම නිසා, අප රට හා සමාන අපනයන සපයමින් සිටි බංග්ලාදේශය, වියට්නාමය සහ ඉන්දියාව වැනි රටවල් සමග තරගකිරීමට අපහසු තත්වයක් ශ්‍රී ලංකාවට ඇතිවිය. මෙම තත්වය ඉතා අහිතකර අන්දමින් බලපානු ලැබුවේ තම නිෂ්පාදිත විවිධාංගීකරණය කිරීමට අවශ්‍යකරන මූල්‍යමය හා තාක්ෂණික සම්පත් සොයාගත නොහැකි වූ මධ්‍යම පරිමාණයේ ඇඟලුම් නිෂ්පාදන ආයතන වලට ය. එම කර්මාන්ත ශාලා බොහෝමයක් වසා දැමීමට සිදුවිය. එසේම GSP+ තීරුබදු සහනය හිමි කරගෙන සිටි බංග්ලාදේශය සහ වියට්නාමය වැනි රටවලට ශ්‍රී ලාංකික ආයෝජකයන් මෙන්ම විදේශීය ආයෝජකයෝ ද යොමු වූහ. මෙම තත්වය තුළ ජී.එස්.පී. ප්ලස් සහනය යළි ලබාගත හැකි වීම ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය උසස් කර ගැනීමට දායක වනු ඇත.

- තීරුබදු සහනය විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ ඇඟලුම් සහ ධීවර නිෂ්පාදන ක්ෂේත්‍රයට විශාල ජවයක් සපයනු ලැබේ. එසේම ශ්‍රී ලංකාවේ පශ්චාද් යුධ සාමකාමී පරිසරය තුළ යළි ඉස්මතුවෙමින් පවතින කුඩා පරිමාණ නිෂ්පාදන ක්ෂේත්‍රයන්ට අපනයන වෙළෙඳපොළවල් සඳහා ප්‍රවේශ වීමට ද මෙම තීරුබදු සහනය විශාල ඉඩ ප්‍රස්තාවක් සපයා තිබේ.

- එසේම ශ්‍රී ලංකාවට විදේශීය ආයෝජකයන් ආකර්ශණීය කර ගැනීම සඳහා ද තීරුබදු සහනය යළි ස්ථාපිත කිරීමෙන් උදා වූ හිතකර පරිසරය දායක වනු ඇත. තීරුබදු සහනයේ වාසි ලබා ගනිමින් අපනයන කර්මාන්ත මෙම රට තුළ ආරම්භ කිරීමට විදේශීය ආයෝජකයන් පෙළඹෙනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

(ඕනෑම කරුණකට ලකුණු 02 බැගින් ලකුණු 04 යි)

| | | |
|---|---|---|
| 9. (i) | රටක ජීවන තත්ත්වය මැනීමෙලා දළ දේශීය නිෂ්පාදිතය යොදා ගැනීමේ දුර්වලතා සඳහන් කරන්න. | (ලකුණු 04 යි) |
| (ii) | 'නිෂ්පාදන ධාරිතාව' යන සංකල්පය පැහැදිලි කරන්න. | (ලකුණු 02 යි) |
| (iii) | කිසියම් රටක නිෂ්පාදන ධාරිතාව තීරණය කරන මූලික සාධක කවරේ ද? | (ලකුණු 04 යි) |
| (iv) | ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව මනිනු ලබනුයේ කෙසේ ද? | (ලකුණු 05 යි) |
| (v) | ජනගහනය වියපත් වීම නිසා ශ්‍රී ලංකාව මුහුණ පා සිටින ප්‍රධාන ආර්ථික අභියෝග කවරේ ද? | (ලකුණු 05 යි) |

9. (I)

- දළ දේශීය නිෂ්පාදිතය රටක නිෂ්පාදනය කරනු ලබන භෞතික භාණ්ඩ හා සේවා ප්‍රමාණය කැටිකොට දක්වන මිනුමක් වන අතර, පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය කෙරෙහි බලපෑම් කරන ගුණාත්මක කරුණු (උදා : සාමකාමී පරිසරයක්, අදහස් ප්‍රකාශනයේ නිදහස, යහපාලනය, තේරීමේ නිදහස යනාදිය) එම මිනුම තුළ සලකා නොබැලේ.

- නොවිධිමත් අංශයේ නිෂ්පාදනයේ වටිනාකම් නිවැරදිව පිළිබිඹු නොවන බැවින්, රටතුළ නිපදවනු ලබන සැබෑ භෞතික භාණ්ඩ හා සේවා ප්‍රමාණය වුව ද එමගින් නිවැරදි ව නොමැනේ. නොවිධිමත් අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ ඇස්තමේන්තු කළ අගයන්, සැබෑ අගයට වඩා ඌන තක්සේරු වූ හෝ අධි තක්සේරු වූ හෝ අගයන් විය හැකි ය.

- දළ දේශීය නිෂ්පාදිතයට අදාළ සංඛ්‍යා, රටක ආදායම් ව්‍යාප්තියේ ස්වභාවය මුළුමනින් ම අමතක කොට ඇත. ජීවන තත්ත්වය කෙරෙහි සෘජු බලපෑමක් ඇති ආදායම් විෂමතාවන් ජාතික ගිණුම් දත්තවල පිළිබිඹු නොවේ.

- දළ දේශීය නිෂ්පාදිතය සහ ඒ හා අදාළ අනෙකුත් සංකල්ප (ප්‍රතිශීර්ෂ ආදායම, මූර්ත ආදායම) ජීවන තත්ත්වය පිළිබඳ අසම්පූර්ණ මිනුම් වේ. බොහෝ ඵලදායි නිෂ්පාදන ක්‍රියාකාරකම් එමගින් පිළිබිඹු නොවේ. උදාහරණ වශයෙන් තමන් විසින් ම නිවස තුළ ඉටු කරන ඵලදායි කටයුතු, ගෘහණියන්ගේ සේවාවන් යනාදිය දැක්විය හැකි ය.

- නිවැරදි තොරතුරු සපයාගත නොහැකි නිසා නිරීක්ෂණය නොකරනු ලබන ආර්ථිකයේ සිදුවන නීතිවිරෝධී ආර්ථික ක්‍රියාකාරකම් (උදා: නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ මත්පැන්) වල වටිනාකම් දළ දේශීය නිෂ්පාදිතය තුළ ඇතුළත් නොවේ.

- දළ දේශීය නිෂ්පාදිතය තුළ ඇතුළත් භාණ්ඩ හා සේවා මිනිසුන්ගේ ජීවිතයේ ගුණාත්මක තත්වය කෙරෙහි කෙසේ බලපානු ලැබේදැයි එය සලකා නොබලයි. උදාහරණයක් වශයෙන් නාගරික ප්‍රදේශවල ජීවත් වන මිනිසුන්ට තම ආදායමින් සැලකිය යුතු කොටසක් නාගරීකරණය ආශ්‍රිත ගැටලු විසඳාගැනීම සඳහා යොමු කිරීමට සිදු වේ. නිදසුනක් වශයෙන් නාගරික ප්‍රදේශ වල මිනිසුන්ට තම නිවාස හා

දේපළ සොරසතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීමට විශේෂ ආරක්ෂක විධිවිධාන සහ උපකරණ මිල දී ගැනීමට සිදුවේ. ආත්මාරක්ෂක ක්‍රම පුහුණුවීමේ පංතිවලට යාමට සිදුවේ. ආතතිය සමනය කර ගැනීම සඳහා ඖෂධ මිල දී ගැනීමට සිදුවේ.

- මිනිසුන් ජීවත්වන පරිසරයේ ගුණාත්මක තත්වය දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා වලින් සොයා නොබැලේ. පරිසර දූෂණය වළක්වා ගැනීමට යොදා ගැනෙන නීති රීති ඉවත් කරනු ලැබුවහොත් කිසියම් රටකට නිමැවුම් මට්ටම (දළ දේශීය නිෂ්පාදනය) ඉහළ නංවාගත හැකිය. එහෙත් මෙහි දී ඉහළ ආදායම් මට්ටමක් හෝ ඉහළ ප්‍රතිශීර්ෂ ආදායමක් හෝ තිබූ පමණින්, ජීවන තත්වය උසස් වී ඇතැයි නිගමනය කළ නොහැකි ය. ආදායම ඉහළ ගොස් තිබිය දී වාතය, ජලය සහ වෙනත් සම්පත් දූෂණයට ලක්ව තිබිය හැකි ය.

- මිනිසුන්ගේ ජීවිතයේ ගුණාත්මක තත්වයට සෘජුවම බලපාන විවේක කාලය සඳහා දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා මගින් වටිනාකමක් ලබා නොදේ. මිනිසුන් දිනකට පැය 12 ක් සහ සතියකට දින 7 ක් වැඩෙහි යෙදුණොත් රටකට දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නංවා ගත හැකි ය. මිනිසුන්ට විවේක කාලයක් භුක්ති විඳීමට නිදහසක් නොමැති නම් භාණ්ඩ හා සේවා ප්‍රමාණය ඉහළ නංවාගැනීමෙන් උසස් ජීවන මට්ටමක් තහවුරු කරගත නොහැකි වේ.

- දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී යහපත් භාණ්ඩ සහ අයහපත් භාණ්ඩ වශයෙන් ප්‍රභේදයක් නොදකී. කිසියම් රටක භූමි කම්පාවක් හටගෙන නිවාස, ගොඩනැගිලි සියල්ල පුනරුත්ථාපනය කරනු ලැබුවහොත්, දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නගී. පුද්ගලයෝ රෝගී තත්වයට පත් වී එයින් බැළැකීම සඳහා රෝහල් ගත වුවහොත් සහ ඖෂධ මිල දී ගත් විට, දළ දේශීය නිෂ්පාදිතය ඉහළ නගී. එහෙත් භූමි කම්පා හට ගැනීම හෝ මිනිසුන් රෝගී තත්වයට පත්වීම හෝ ජීවන තත්වය උසස් වීමට දායක වේයැයි කිසිවකු නොපවසයි.

- තාක්ෂණයේ ප්‍රතිලාභ සැලකිල්ලට ගැනීමට ද දළ දේශීය නිෂ්පාදිත සංඛ්‍යා අසමත්ව සිටී. විවිධ නොමිල මෘදුකාංග (free Apps.) ඔස්සේ ඔබගේ ජංගම දුරකථනයට ලැබෙන විවිධ පහසුකම් (උදා : මාර්ග සිතියම්, කාලගුණ තොරතුරු, මාර්ග තදබදය පිළිබඳ තොරතුරු හා වෙනත් සංනිවේදන පහසුකම්) ගුණාත්මක ජීවන තත්වය උසස් කිරීමට විශාල දායකත්වයක් සපයයි. එහෙත් ඒවා සඳහා මිලක් අය නොකෙරෙන බැවින් එම ප්‍රතිලාභ ජාතික ගිණුම් වටිනාකම් තුළ පිළිබිඹු නොවේ.

(ඕනෑම එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු 04 යි)

(ii) - ආර්ථිකයක තිරසාර ලෙස, උද්ධමන පීඩනයකින් තොරව, නිෂ්පාදනය කිරීමට හැකියාව ඇති මුළු භාණ්ඩ හා සේවා ප්‍රමාණය රටක නිෂ්පාදන ධාරිතාව යන්නෙන් අදහස් වේ. ආර්ථිකයේ ප්‍රාග්ධන තොගය සහ ශ්‍රමය පූර්ණ ලෙස සහ කාර්යක්ෂම ලෙස උපයෝජනය කරනු ලැබුවහොත්, නිෂ්පාදනය කළ හැකි භාණ්ඩ හා සේවා ප්‍රමාණයයි. නිෂ්පාදන ධාරිතාව හැඳින්වීමට යොදා ගැනෙන තවත් පදයක් නම් විභව නිමැවුමයි.

(ලකුණු 02 යි)

විකල්ප පිළිතුර :

- යන්ත්‍ර සූත්‍ර හා උපකරණ වැනි සියලු ස්ථාවර ප්‍රාග්ධන වත්කම් කාර්යක්ෂම ලෙස උපයෝජනය කරන්නේ නම් සහ වැටුප් අනුපාතික වෙනස් වීම් වල ස්ථායිතාව රැකෙන ආකාරයට විරැකියා අනුපාතිකය, එහි ස්වාභාවික මට්ටමෙහි පවත්වා ගන්නේ නම්, ලබාගත හැකි නිමැවුම් මට්ටම ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව ලෙස සැලැකේ.

(ලකුණු 02 යි)

(iii)

- භෞතික ප්‍රාග්ධනය
- මානව ප්‍රාග්ධනය
- ස්වාභාවික ප්‍රාග්ධනය
- සමාජ ප්‍රාග්ධනය
- තාක්ෂණය
- ඵලදායිතාව

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු හතරක් සඳහා ලකුණු 04 යි)

(iv)

- කුටුම්බ ප්‍රතිශීර්ෂ පරිභෝජනය නිල දරිද්‍රතා රේඛාවට වඩා පහළ අගයක් ගනු ලබන පුද්ගල සංඛ්‍යාවගේ ප්‍රතිශතය ලෙස ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම මැනේ.

(ලකුණු 02 යි)

- ජනගහන දරිද්‍රතා දර්ශකය හෙවත් දිළිඳු කුටුම්බ ප්‍රතිශතය ගණනය කරනු ලබන්නේ කුටුම්බ ආදායමේ - වියදම් සමීක්ෂණයක් ඔස්සේ කුටුම්බවල සියලුම ආහාර සහ ආහාර නොවන පරිභෝජන වියදම් සැලකිල්ලට ගනිමිනි. විවිධ දිස්ත්‍රික්ක අතර තිබිය හැකි ජීවන වියදම් වෙනස්කම් සහ කුටුම්බ තුළ සිටින පුද්ගල සංඛ්‍යාව ද මෙහි දී සැලකිල්ලට ගනී. (ලකුණු 01 යි)

- එලෙස ඇස්තමේන්තු කරනු ලබන කුටුම්බ ප්‍රතිශීර්ෂ පරිභෝජන වියදම ජාතික දරිද්‍රතා රේඛාව සමග සංසන්දනය කෙරේ. ජාතික දරිද්‍රතා රේඛාව නිර්වචනය කරනු ලැබ ඇත්තේ පුද්ගලයෙකුට දිනකට කිලෝකැලරි 2030 ක කැලරි අවශ්‍යතාවක් සපුරා ගැනීමට, කොතරම් මුදලක් වියදම් කිරීමට සිදුවේ ද යන්න පදනම් කර ගනිමිනි. 2012/13 ආදායම් වියදම් සමීක්ෂණයේ තොරතුරු මත ඇස්තමේන්තු කරන ලද දරිද්‍රතා රේඛාවේ වටිනාකම රුපියල් 3624 ක් විය.

(ලකුණු 01 යි)

- කුටුම්බයක මාසික මූර්ත ප්‍රතිශීර්ෂ පරිභෝජන වියදම නිල දරිද්‍රතා රේඛාවට වඩා අඩුද යන්න මත දරිද්‍රතාවට මුහුණ දී සිටින පුද්ගලයන් හඳුනාගනු ලැබේ.

(ලකුණු 01 යි)

(v)

- සිය ප්‍රධාන ආදායම් මාර්ගය ලෙස විශ්‍රාම වැටුප් හිමිවනුයේ, ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනයෙන් දහයෙන් කොටසකට පමණක් බව ඇස්තමේන්තු කොට ඇත. එබැවින් වැඩිහිටියන් සඳහා පවුලෙන් ලැබෙන උපකාර සහ අනුග්‍රහයන් ඉදිරි දශක කීපය තුළ දී ද තවදුරටත් වැදගත් වේ. එසේ වුවද, සීඝ්‍ර නාගරීකරණයත් සමග කුඩා පවුල් ඇතිවන බැවින් වැඩිහිටියන් සඳහා පවුලෙන් ලැබෙන උපකාර අඩුවීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබේ. ග්‍රාමීය - නාගරික සංක්‍රමණය සහ ශ්‍රම බලකායේ

ස්ත්‍රී සහභාගීත්වය ඉහළයාම නිසා, ග්‍රාමීය ප්‍රදේශවල පවා වැඩිහිටියන්ට උපකාර කිරීම හා රැකබලා ගැනීම තවදුරටත් ගැටලුකාරී වේ.

- විශ්‍රාම වැටුප් සහ සෞඛ්‍ය වියදම් ඉහළයාම නිසා රජයේ අයවැය මත අනිවාර්යයෙන් පීඩනයක් ඇතිවන අතර, මෙම කත්වයන් හේතුවෙන් වෙනත් අංශ මත ඇතිවන අහිතකර බලපෑම් (උදා : සංවර්ධන වියදම් කප්පාදු කිරීම) බරපතල ගැටලු බවට පත්විය හැකිය.

- වැඩකරන වයසේ පුද්ගලයෙකුට සාපේක්ෂව, වියපත් පුද්ගලයෙකු විසින් කරනු ලබන ඉතුරුම් ප්‍රවාහය අඩුබැවින්, එය ආර්ථිකයේ ප්‍රාග්ධන සම්පාදනය මත සැලකිය යුතු නිශේධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත.

- වියපත් වීම හේතුවෙන් වැඩ කරන වයසේ පසුවන ජනගහනයේ ප්‍රතිශතය අඩුවීම, ආර්ථික වර්ධනය අඩාල කරමින් ශ්‍රම බලකාය හීන කිරීමට හේතු විය හැකිය. එමගින් ආදායම් බදු පදනම මෙන්ම කුටුම්බ ආදායම ද අඩුවිය හැකි අතර ඒ හේතුවෙන් රජයේ බදු ආදායම තවදුරටත් පහළ යා හැකි ය.

- ඉදිකිරීම්, කෘෂි කර්මාන්තය, සෞඛ්‍යය හා හෝටල්/ සංචාරක ක්ෂේත්‍රය ඇතුළු අංශ කිහිපයක ශ්‍රම හිඟයකට ශ්‍රී ලංකාව දැනටමත් මුහුණ පාමින් සිටී. ශ්‍රමය සංක්‍රමණය වීමට අමතරව ජනගහනය වියපත් වීම ද ශ්‍රම හිඟය සඳහා යම් දායකත්වයක් සපයනු ලබන අතර, මෙම ප්‍රවණතාව ඉදිරි දශක කීපය තුළ දී වඩාත් හොඳින් දැකගත හැකි වනු ඇත.

- අධ්‍යාපනය හා ආදායම් මට්ටම් ඉහළයාමත් සමග සාපේක්ෂව ඉහළ වැටුප් හා පිළිගැනීමක් පැවැතීම හේතුවෙන් මෙරට තරුණ පිරිස් සුදු කරපටි රැකියා කරා යොමුවීමේ ප්‍රවණතාවක් ඇත. එහි ප්‍රතිඵලය වශයෙන් විදේශීය සංක්‍රමණික ශ්‍රමිකයන් කෘෂි කාර්මික කටයුතු සමඟරක සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතු වල යෙදී සිටී. එබැවින් ජනගහනයේ සිදුවන වෙනස්කම්, නව පරම්පරාවේ අභිලාශයන්, ශ්‍රම සංක්‍රමණ, රාජ්‍ය මූල්‍ය ගැටලු හා දේශීය ආර්ථිකය හා යනාදිය සැලකිල්ලට ගෙන සවිස්තරාත්ම ශ්‍රම වෙළඳපොළ ප්‍රතිපත්තියක් සකසා ගැනීමේ අවශ්‍යතාව පවතී.

- ශ්‍රී ලංකාවේ වියපත් වන ජනගහනයෙන් කාන්තා ප්‍රතිශතය ක්‍රමයෙන් ඉහළ යාමක් පවතී. වියපත් ස්ත්‍රී ජනගහනයෙන් වැඩි කොටසක් එම කාණ්ඩයේ පුරුෂයන්ට සාපේක්ෂව ආර්ථිකමය වශයෙන් සක්‍රීය නොවේ. මෙම අවදානම් වයසේ පසුවන ස්ත්‍රී යැපෙන්නන් ඉලක්ක කරගත් ඉදිරිගාමී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම අභියෝග පහකට ලකුණු 05 යි)

10. (i) ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් සංවර්ධනයෙහිලා යොදා ගත හැකි උපායමාර්ගයක් වශයෙන් රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයේ (PPP) වාසි කවරේ ද? (ලකුණු 05 යි)

(ii) "ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව සහ ආයෝජන වාතාවරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව දිගින් දිගට අසමත්භාවයක් පෙන්නුම් කොට තිබේ." ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී බලපා ඇති වඩාත් ගැටලුකාරී සාධක කවරේ ද? (ලකුණු 05 යි)

(iii) "සංචාරක කර්මාන්තය ශ්‍රී ලංකා ආර්ථිකයේ වේගයෙන් වර්ධනය වන ක්ෂේත්‍රයක් බවට පත්ව තිබේ." විදේශ විනිමය ඉපයීම සහ රැකියා නියුක්තියට සංචාරක කර්මාන්තයේ මෑත කාලීන දායකත්වය පෙන්වා දී, එම කර්මාන්තය වර්තමානයේ මුහුණ දෙන අභියෝග සාකච්ඡා කරන්න. (ලකුණු 05 යි)

(iv) "ශ්‍රී ලංකාවේ ග්‍රාමීය දිළිඳු ජනගහනයෙන් අධික ම සුළු පරිමාණ ගොවීයෝ වෙති." අඩු ඵලදායිතාව හා අඩු ආදායම් සඳහා හේතු වන දේශීය කෘෂිකර්මාන්තයේ ප්‍රධාන ගැටලු හඳුනාගන්න. (ලකුණු 05 යි)

10. (I)

- යටිතල පහසුකමේ සංවර්ධනයෙහිලා වඩාත් සාර්ථක ක්‍රමවේදයකි. තනිකරම පෞද්ගලික අංශය හෝ රාජ්‍ය අංශය හෝ එම කාර්යයේ ඉටු කරනවා වෙනුවට, ඒ දෙපාර්ශ්වයම සහභාගී වෙමින් තම තමන්ට වඩාත් හොඳින් කළ හැකි කාර්යයන් ඒ ඒ පාර්ශ්වය විසින් තෝරාගෙන ව්‍යාපෘති ක්‍රියාවට නැගිය හැකි වේ.

- ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය කඩිනම් කරමින් ප්‍රමාද වීම වළක්වා ගත හැකි වේ. කාර්ය සාධනය මනින දර්ශකයක් ලෙස ව්‍යාපෘති නිම කිරීමට ගත වන කාලය යොදාගත හැකිය.

- තනිකරම රජය හෝ පෞද්ගලික අංශය හෝ ඉටුකරන ව්‍යාපෘතියකට වඩා ඉහළ ආයෝජන ලබන අනුපාතිකය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති මගින් අත්කර ගත හැකිය. දෙපාර්ශ්වයම එක්ව ක්‍රියාත්මක කරන විට සැලසුම් කිරීම හා මූල්‍යකරණය යන කරුණු සලකා නව්‍ය ක්‍රමවේද යොදා ගැනීමට අවස්ථාව සැලසේ.

- ව්‍යාපෘතියක අවදානම් සියල්ල ඇගයීමකට ලක්කොට එහි ශක්‍යතාව තීරණය කරනු ලැබේ. හුදෙක් රජයේ දේශපාලන අවශ්‍යතා සහ වෙනත් අභිලාෂයක් මත ශක්‍යතාවකින් තොර ව්‍යාපෘතියක් ක්‍රියාවට නැගීමට සැලසුම් කරනු ලැබුව හොත් පෞද්ගලික අංශය එවැන්නක් ක්‍රියාත්මක කිරීමට එකඟ නොවනු ඇත.

- පිරිවැය පාලනය කිරීමෙහිලා වඩා පළපුරුද්ද සහ අත්දැකීම් ඇති පෞද්ගලික අංශය වෙත ව්‍යාපෘති මෙහෙයවීම සහ ක්‍රියාවට නැගීමේ අවදානම් පැවරීමට රජයට අවස්ථාව සැලසේ.

- බොහෝ රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘතිය තුළ කල්තබා ව්‍යාපෘති නිම කිරීම වෙනුවෙන් ලබාදෙන ප්‍රසාද දීමනා (bonus) ඇතුළත් වන බැවින්, සියලු ව්‍යාපෘති වඩාත් කාර්යක්ෂමව නිම කිරීමට හැකියාව ලැබේ.

- රජයේ අරමුදල් වඩාත් කාර්යක්ෂම ලෙස වැය කිරීම මේ යටතේ ඉඩ සැලසෙන බැවින් සමාජ ආර්ථික වැදගත් කමක් ඇති වෙනත් ක්ෂේත්‍ර කෙරෙහි සීමිත රාජ්‍ය අරමුදල් යොමු කිරීමට අවස්ථාව උදා වේ.

- රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව සහිත ව්‍යාපෘතිවල කාර්යක්ෂමතාව වැඩි බැවින්

එය රාජ්‍ය මූල්‍යයට වාසිදායක වේ. අයවැය පරතරය අඩු කර ගැනීමට දායක වනු ඇත.

- ව්‍යාපෘති ජීවන චක්‍රයේ සෑම අදියරකදීම ඉහළ ප්‍රමිති මට්ටමක් පවත්වා ගෙන යාමට හැකියාව ලැබේ.

- රාජ්‍ය වියදම් අඩුකර ගැනීමට ඉඩ සැලසෙන බැවින් ජනතාව මත බදු බර ද අඩු විය හැකිය.

- පෞද්ගලීකරණ ක්‍රමවේදයන්ට සමාජයේ දැඩි විරෝධතාවක් පවතින විට එයට සාර්ථකව මුහුණ දිය හැකි විකල්ප ප්‍රවේශයක් ලෙස රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘති දැක්විය හැකි ය.

(ඕනෑම කරුණකට ලකුණු 01 බැගින් කරුණු පහකට ලකුණු 05 යි)

(ii)
- ප්‍රතිපත්ති අස්ථායිතාව / අවිනිශ්චිතතාව
- මූල්‍ය ණය සඳහා ඉඩ ප්‍රස්ථා සීමා වීම.
- අකාර්යක්ෂම රාජ්‍ය නිලධාරී තන්ත්‍රය
- ඉහළ බදු අනුපාතික
- සංකීර්ණ බදු රෙගුලාසි
- යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම.
- උද්ධමනය
- ජාතික ශ්‍රම හමුදාවේ වැඩපොළ විනය දුර්වල වීම.
- දූෂණය
- නවෝත්පාදන බිහි කිරීමට ඇති ධාරිතාව සීමා සහිත වීම
- දේශපාලන අස්ථායිතාව
- විදේශ විනිමය පිළිබඳ පවතින රෙගුලාසි
- උගත් ශ්‍රම හමුදාව ප්‍රමාණවත් නොවීම.
- ශ්‍රම වෙළෙඳපොළ රෙගුලාසි දැඩිවීම.
- අපරාධ සහ සොරකම්

(එක් කරුණකට ලකුණු 01 බැගින් එකිනෙක කරුණු පහකට ලකුණු 05 යි)

(iii)
- විදේශ විනිමය ඉපයීම් :

| මුදල් ඒකකය | 2015 | 2016 |
|---|---|---|
| ශ්‍රී ලංකා රුපියල් මිලියන | 405,492 | 512,294 |
| ඇමෙරිකානු ඩොලර් මිලියන | 2,981 | 3,518 |

(ලකුණු 01 යි)

**විකල්ප පිළිතුර :**

- ශ්‍රී ලංකාවේ මුළු විදේශීය විනිමය ඉපයීම් සඳහා සංචාරක කර්මාන්තයේ දායකත්වය 2015 දී 12.4% ක් වූ අතර 2016 වර්ෂයේ දී එය 14.2% ක් විය. විදේශ ප්‍රේෂණ සහ රෙදිපිළි හා ඇඟලුම් වලට පසුව තුන් වැනි තැනට පත්ව ඇත්තේ සංචාරක කර්මාන්තය යි.

(ලකුණු 01 යි)

- සේවානියුක්තියට දායකත්වය :

| | 2014 | 2015 | 2016 |
|---|---|---|---|
| සෘජු සේවා නියුක්තිය | 129,790 | 135,930 | 146,115 |

(ලකුණු 01 යි)

**විකල්ප පිළිතුර :**

- සංචාරක කර්මාන්තය බිහිකළ සෘජු සහ වක්‍ර සේවා නියුක්තිය 2015 දී 319,436 ක් වූ අතර, 2016 දී 335,659 ක් විය.

(ලකුණු 01 යි)

සංචාරක කර්මාන්තය මුහුණ දෙන අභියෝග :

- සංචාරකයින්ගේ අපේක්ෂිත වර්ධනයට සමගාමීව හෝටල් කාමර ප්‍රමාණවත් නොවීම. අපේක්ෂිත විශාල සංචාරක ප්‍රමාණයකට පහසුකම් සැලසීම සඳහා හෝටල් කාමර 40,000 ත් 50,000 ත් අතර ප්‍රමාණයක් අවශ්‍ය වෙතියි ඇස්තමේන්තු කොට ඇතත්, 2016 අවසානයේ දී සංචාරක හෝටල් හා අතිරේක ආයතන යන දෙඅංශයම සතුව පැවැතියේ හෝටල් කාමර 34,000 ක් පමණි.

- පුහුණු සේවකයන්ගේ අවශ්‍යතාව සහ ශ්‍රම සංක්‍රමණය :
සංචාරක කර්මාන්තයේ නියැලුණු ශ්‍රී ලාංකික පුහුණු ශ්‍රමිකයින් විශාල පිරිසක් ඉහළ වැටුප් වෙනුවෙන් විදේශීය රටවල සේවයේ යෙදී සිටී. සංචාරක කර්මාන්තයේ ඉහළ යන පුහුණු ශ්‍රමික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය සේවක පුහුණු කිරීම රජයට  කිරීම සිදුකළ නොහැකි බැවින් ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ හවුල් කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

- ලෝක ප්‍රසිද්ධ හෝටල් දාම ශ්‍රී ලංකාව වෙත දක්වා ඇති අවධානය ප්‍රමාණයක් නොවීම : බොහෝ ප්‍රමුඛ පෙළේ හෝටල් දාම ඔවුන්ගේ හෝටල් ව්‍යාපාර ශ්‍රී ලංකාවෙන් තවමත් ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ත කොට නොමැත. ෆෝබ්ස් සඟරාව නම්කර ඇති ලොව හොඳම අන්තර් ජාතික සුඛෝපභෝගී හෝටල් දාම සන්නාම 10 අතුරින් ශ්‍රී ලංකාවේ දක්නට ඇත්තේ හෝටල් දාම තුනක් පමණි.

- නොවිධිමත් අංශය අන්තර්ග්‍රහණය කිරීම :
සංචාරක කර්මාන්තයේ විධිමත් අංශය හොඳින් නියාමනය වී තිබුණ ද, කර්මාන්තය තුළ සැලකිය යුතු අවිධිමත් අංශයක් ක්‍රියාත්මක වෙමින් පවතී. එබැවින් විධිමත් අංශය වෙත එම කොටස ද අන්තර් ග්‍රහණය කර ගැනීම සඳහා අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. නොවිධිමත් අංශය තුළ සංචාරක කර්මාන්තයේ ආරක්ෂාව සහ ආචාර ධර්ම වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වන අතර, එසේ කිරීමට අපොහොසත් වීම රටේ යහපත් ප්‍රතිරූපය බිඳ වැටීමට හේතුවනු ඇත.

- විශාල විභවතාවක් පවතින චීනයෙන් පැමිණෙන සංචාරකයින්ගේ වර්ධනයට සරිලන සේ පහසුකම් සැපයීමට ඇති හැකියාව : සංචාරක කර්මාන්තයේ දැනට පවතින වර්ධනය වෙමින් පවතින චීන සංචාරකයන් සඳහා අවශ්‍ය පහසුකම් සපුරාලීමේ දී නව අභියෝග නිර්මාණය වී ඇත. එහි දී චීන භාෂාවෙන් විකාශණය වන රූපවාහිනිය හා ගුවන් විදුලි නාලිකා, චීන භාෂාව කථාකරන සංචාරක මග පෙන්වන්නන් යනාදිය අවශ්‍ය වේ.

- නැවතී සිටින රාත්‍රී සංඛ්‍යාව ලෙස ගණනය කෙරෙන සංචාරකයෙකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව වසර ගණනාවක් පුරා එකළෙසම පැවැතීම : දෛනික සංචාරක වියදම පසුගිය වසර කීපය පුරා වර්ධනය වී තිබුණ ද, ප්‍රධාන වශයෙන් ම සංචාරකයන් සඳහා ශ්‍රී ලංකාවේ පවතින ක්‍රියාකාරකම් අඩුවීම නිසා සංචාරකයෙකු නැවතී සිටින සාමාන්‍ය කාල සීමාව සංචාරක රාත්‍රී 10 ක් පමණ නොවෙනස් ව පවතී. එම නිසා ශ්‍රී ලංකාවේ පවතින සංචාරක ආකර්ශණයන් විවිධාංග කරණය කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගත යුතු වන අතර, එහි දී සංචාරක රාත්‍රී සංඛ්‍යාව අවම වශයෙන් සති දෙකක් ලෙස ඉලක්ක කිරීම සඳහා මගී, නෞකා සහ සාමුද්‍රික සංචාර, විවේකය අරමුණු කරගත් සංචාර, විනෝදාස්වාදය අරමුණු කරගත් සංචාර, වැනි සංචාරක කර්මාන්තයේ පසුගාමී අංශ කෙරෙහි වඩාත් අවධානය යොමු කළ යුතු වේ.

- නව නිර්මාණාත්මක ප්‍රවේශයක අවශ්‍යතාව :
තොරතුරු ලබා ගැනීම සඳහා පමණක් නොව, බස්රථ, දුම්රිය, කුලී රථ සහ හෝටල් වෙන් කිරීම, ජංගම දූරකථන සම්බන්ධතා, වයි-ෆයි සම්බන්ධතා, සංචාරක සැලසුම් ආදී වූ පුළුල් පරාසයක පැතිරෙන පරිදි සංචාරකයනට සේවා සපයන්නා වූ බහුකාර්ය සංචාරක තොරතුරු මධ්‍යස්ථාන සංඛ්‍යාව ප්‍රධාන සංචාරක ආකර්ශණයන් හි සහ ප්‍රධාන ප්‍රවාහන කේන්ද්‍රස්ථානයන්හි තවදුරටත් වැඩි කිරීම අවශ්‍යතාවක් පවතී.

- සංචාරක ක්ෂේත්‍රය සම්බන්ධ රාජ්‍ය ආයතන ද පෞද්ගලික අංශය ද ඇතුළුව සංචාරක කර්මාන්තයේ නියුතු සියලුම පාර්ශ්වකරුවන් අධීක්ෂණය කිරීම සඳහා ඉහළ මට්ටමේ රාජ්‍ය ව්‍යුහයක් අවශ්‍යවන අතර එමගින් වඩා සහසම්බන්ධතාවයකින් යුතුව ඉහළ මට්ටම් ක්‍රමෝපාය ක්‍රියාවට නැගීමට ඉඩ සැලසෙනු ඇත.

(ඕනෑම එක් කරුණකට ලකුණු 01 බැගින් කරුණු තුනකට ලකුණු 03 යි)

(iv)

- ජල සැපයුම ප්‍රමාණවත් නොවීම, ජල කළමනාකරණය දුර්වල වීම, ඇළ මාර්ග, වැව් සහ ඇනිකට් වැනි වාරිමාර්ග පහසුකම් වල පවත්නා දුර්වලතා.

- දැඩි නියං කාලයන් පැවැතීම, ජල ගැලීම සහ ලවණ ජලය ගලා ඒම වැනි කරුණු නිසා කාර්මික භෝගවල ඵලදාව පහළ වැටීම.

- පාංශු ඛාදනය වැනි හේතු නිසා පසේ සශ්‍රීකත්වය අඩුවීම.

- වරින් වර හඳුන්වා දෙනු ලැබූ විවිධ කෘෂි සංවර්ධන ව්‍යාපෘති අකාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවීම. (උදා : 2007 වර්ෂයේ හඳුන්වා දෙන ලද ජාතික කෘෂි කාර්මික ප්‍රතිපත්තිය, 'අමිහ', විශ්‍ව සංක්‍රාමය, ගොවි සෙවන, අපි වවමු රට නගමු, යනාදිය)

- තාක්ෂණය භාවිතය පසුගාමී වීම.
විද්‍යාත්මක ගොවිතැන් ක්‍රම අනුගමනය නොකිරීම, ඉහළ ඵලදාව ලබාදෙන බීජ හිඟකම, සාම්ප්‍රදායික ක්‍රම මත දැඩිව රඳා පැවැත්ම

- අලෙවිකරණයෙ ආශ්‍රිත ගැටලු : වී අලෙවි මණ්ඩලය වැනි ආයතන ඔස්සේ ක්‍රියාත්මක වන රාජ්‍ය යන්ත්‍රණයෙන් අකාර්යක්ෂම වීම.

- පොහොර සහනාධාර වෙනුවට මූල්‍ය ආධාර ලබාදීම.

- පශ්චාද් අස්වනු හානි

- ව්‍යාප්ති සේවා දුබල වීම.

- ග්‍රාමීය මට්ටමින් කෘෂි කර්මය පදනම් කරගත් කර්මාන්ත ප්‍රමාණවත්ව බිහි නොවීම.

- වන සතුන් නිසා සිදුවන වගා හානි

- අනාර්ථික බිම් කැබලි වල වගා කටයුතු කිරීම.

(එක් කරුණකට ලකුණු 01 බැගින් ඕනෑම කරුණු පහකට ලකුණු 05 යි)


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
GUIDE
PAST PAPERS
G.C.E. O/L
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440